# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## වාර්ෂික වාර්තාව - 2012



## සභාපතිතුමාගේ පණිවුඩය

ආයතනයක මූල්‍යමය සහ මූල්‍යමය නොවන කාර්ය සාධනය අනාවරනය කරන ප්‍රධාන මෙවලමක් වන වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට හැකි වීම පිළිබඳ මම සතුටු වෙමි. එපමණක්ද නොව හොඳ වාර්ෂික වාර්තාවකින් මූල්‍යමය ප්‍රතිඵල පිළිබඳ යහපත් දැනීමක් ලබා දෙන අතර, ආයතනයේ අගයයන්, ජයග්‍රහණ සහ දායකත්ව පිළිබඳ තොරතුරුද සමාජයට පෙන්වා දේ.

2012 වසරේදී දිවයිනේ සමස්ත පාරිභෝගිකයින්ගේ යහපත සඳහා තරඟ විරෝධී චර්යාවන්ගෙන් සහ විෂමාචාර වෙළෙඳුන්ගෙන් ඔවුන් ආරක්ෂා කිරීම අරමුණු කර, සේවකයින් වැඩි ප්‍රමාණයක් බඳවා ගැනීමට පියවර ගතිමු. වෙළෙඳපොළ තුළ යහපත් තරඟකාරීත්වයක් පැවතීම පාරිභෝගිකයින්ගේ යහපත සඳහා ඉතා වැදගත් කරුණකි.

තරඟකාරීත්වය යනු තීරණ ගැනීමේ නිදහස, ආරක්ෂා කරන සහ ප්‍රශස්ත සකසුරුවම ක්‍රියාවට නංවන, සාධාරන වෙළෙඳපලක් බිහිකිරීමෙහිලා අවශ්‍ය වන්නා වූ පූර්ව කොන්දේසියන් බව අධිකාරිය විශ්වාස කරයි.

අප විසින් තරඟකාරීත්ව සම්බන්ධ පුළුල් වපසරියක් ආවරණය කිරීම සඳහා නව නීති සමුදායක් පවත්නා නීති රාමුවට අන්තර්ගත කිරීමට යෝජනා කළෙමු. තරඟවිරෝධී ගිවිසුම් වලට පිවිසීම, තරඟය විකෘති කිරීම, නිෂ්පාදනය, සැපයීම, බෙදා හැරීම, අත්කර ගැනීම ආදිය සම්බන්ධ කුමන්ත්‍රණකාරී එකඟතා ඇති කර ගැනීම නුදුරු අනාගතයේදී මෙම නව නීති සම්මත වීමත් සමඟ අවම වනු ඇත. මහජනයාගේ යහපතට පටහැනිව ක්‍රියාත්මක වන තරඟවිරෝධී චර්යාවන් සම්බන්ධව අධිකාරියට විශාල වශයෙන් මෙමගින් බලපෑම් කළ හැකි වූ ඇත. එමෙන්ම, දැනුවත් කිරීම්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ තුලින් වෙළෙඳපොල තරඟකාරීත්වය වර්ධනය කිරීමට අපි උපදෙස් දී ඇත්තෙමු.

තරඟකාරීත්වය තුළින් අලෙවිය සීමා කිරීම, අසාධාරණ මිළ වැඩිකිරීම්, අසාධාරණ වෙළෙඳ කොන්දේසි, මිළ විචලයනයන්, කොන්දේසි සහිත වෙළෙඳාම ආදිය වලකාලමින් වෙළෙඳපල තුළ අනිසි ආධිපත්‍ය තත්ත්වයක් ඇතිවීම වළකාලයි. මහජන සුභ සිද්ධියට පටහැනිව සිදුවන්නා වූ තරඟකාරීත්වය සම්බන්ධව ව්‍යාපාරිකයන් විසින් අධිකාරියට කරන ලද පැමිණිලි සම්බන්ධව විමර්ශන පවත්වා සාර්ථකව ඒවා විසඳීමට හැකි විය.

එමෙන්ම, 2012 වසරේදී අපහට ලැබුණු පාරිභෝගික පැමිණිලි වලින් 97.6% සඳහා විසඳුම් ලබා දීමට සමත්වූ අතර, පැමිණිළිකරුවන් විශාල සංඛ්‍යාවකගෙන් ප්‍රශංසාත්මක ලිපි හා අගැයීම් ලිපි අප වෙත ලැබුණි. අප විසින් කටයුතු කල ආකාරය හා ඔවුන්ට ලබා දුන් සහන සම්බන්ධයෙන් ඔවුහු ඉතාමත් තෘප්තිමත් වූ බව එම ලිපි වලින් කියැවේ.

"ස්ථානීය දඩ" සම්බන්ධව ප්‍රතිපාදනයන්, පනතේ සංශෝධන වලට ඇතුලත් කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් අවසරය ලබා ගන්නා ලදී. පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට වැදගත් වන විධාන 05ක් නිකුත් කිරීමට අපට හැකිවිය.

ආනයන පරීක්ෂණ ක්‍රමය යටතේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා ශ්‍රී ලංකා රේගුව සමඟ එක්වී අප රටට ගෙන්වූ තත්ත්වයෙන් බාල භාණ්ඩ 146ක් මෙරටට ඇතුළුවන ස්ථානයේදී එසේ ඇතුල්වීම වැලැක්වීමට සාර්ථක පසු විපරම් සැලැස්මක් යොදවන ලදී.

2012 වසරේදී ලෝක වෙළෙඳපලෙහි මිළ ගණන් වෙනස්වීම් ගැන විධිමත් අධ්‍යයනයකින් පසුව සිමෙන්ති, ගෑස් සහ කිරිපිටි යන අත්‍යවශ්‍ය භාණ්ඩ 03 සඳහා අඩුම මිළ වැඩිවීමකට අවසර දීමට සිදු විය. එසේම ලෝක වෙළෙඳපලෙහි ද්‍රවිකෘත ගෑස් මිළ සීඝ්‍රයෙන් ඉහළ යෑම නිසා අපගේ ගෑස් මිළද සැලකිය යුතු මිළකින් ඉහළ නැංවීමට අවසර දීමට සිදු විය.

මෙම විශිෂ්ට ප්‍රතිඵල අප වෙත ළඟා කර ගැනීම සඳහා අතිශයින් වෙහෙස වී කටයුතු කළ සියළු කාර්ය මණ්ඩල වලට මාගේ ප්‍රණාමය පුද කරමි.

ඉහත ජයග්‍රහන ලබා ගැනීමට සහාය දුන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ටද මාගේ කෘතඥ පූර්වක ස්තුතිය පලකරමි.

එමෙන්ම අපගේ තීන්දු තීරන නිවැරදි කිරීමෙන් සහ අනුමත කිරීමෙන් ද, නොයෙක් අයුරින් උපදෙස් ලබා දී කාර්යයන් ඉටු කිරීමට අනුශාසනා සහ අනුමත කිරීම් වලින් සහාය වූ ලේකම්තුමාට සහ ගරු ඇමතිතුමාටද මාගේ හෘදයාංගම ස්තුතිය පල කරමි.

අවසන් වශයෙන් අපගේ ක්‍රියාවලීන්ගෙන් තෘප්තිමත් වී ප්‍රශංසාත්මක ලිපි හා අගැයීම් ලිපි එවූ සියළුම පැමිණිලිකරුවන්ට / පාරිභෝගිකයින්ටද මාගේ ස්තුතිය මෙයින් පුද කරමි.

රූමි මර්ෂුක්
සභාපති

## අපගේ දැක්ම

**සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක් තුළ මනාව සුරක්ෂිත වූ පාරිභෝගිකයෙකු බිහි කිරීම**

## අපගේ මෙහෙවර

**පාරිභෝගික සවිබල ගැන්වීම, වෙළෙඳාම විධිමත් කිරීම සහ යහපත් තරඟකාරීත්ව ප්‍රවර්ධනය කිරීම තුළින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම**

## අපගේ ඒකාබද්ධ ඉලක්කයන්

- පාරිභෝගිකයා වඩාත් තෘප්තියට පත්වන අයුරින් වෙළඳපොල නියාමනය කිරීම

- අසාධාරණ වෙළෙඳ චර්යාවන්ගෙන් පීඩාවට පත් පාරිභෝගිකයන්ට සහන සැලසීම

- පාරිභෝගික අධ්‍යාපනය සහ පාරිභෝගිකයා සවි බල ගැන්වීම

- තරඟ විරෝධී වෙළෙඳ චර්යාවන්ගෙන් නිෂ්පාදකයා හා වෙළෙඳුන් ආරක්‍ෂා කිරීම සහ වඩාත් හිතකර තරඟකාරී වාතාවරණයක් ප්‍රවර්ධනය කිරීම

- හැකියාවන් වැඩි දියුණු කිරීම තුළින් ආයතනික සංවර්ධනය ළඟා කර ගැනීම

# අපගේ ආයතනික සාරධර්ම

- **විශ්වාසදායි බව**
  කාර්යසාධන අනුකූලතාව පවත්වා ගැනීම සහ විශ්වාසනීයත්වය තහවුරු කිරීම
- **අවංකත්වය සහ ඒකීයත්වය**
  සියළුම කාර්යයන්හිදී අවංකවීම, සාධාරණ වීම සහ යුක්ති ගරුක වීම
- **වග කිවයුතු බව**
  විනිවිද භාවය ආරක්ෂා කිරීම, වග කිවයුතු බව සහ ඉටු කරනු ලබන සියළුම කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දැරීම
- **කණ්ඩායම් හැඟීම**
  අන්‍යෝන්‍යය අවබෝධය, එකිනෙකාට ගෞරව කිරීම සහ එකිනෙකා අතර විශ්වාසය ගොඩ නැංවීම සහ මනා සන්නිවේදනය සහ නම්‍යශීලිබව වර්ධනය කරමින් පොදු ඉලක්කයන් ළඟාකර ගැනීම උදෙසා සියළුම සේවකයන් එක්ව කටයුතු කිරීම
- **පිළිගැනීම**
  සේවකයින්ගේ විශිෂ්ඨ කාර්යඵල අගය කිරීම හා ප්‍රශංසා කිරීම
- **කැපවීම**
  පවරා ඇති කාර්යයන් කැපවීමෙන් යුක්තව ඉටු කිරීම
- **ප්‍රතිචාර දැක්වීම**
  සේවා සැලසීම සඳහා කැමැත්තක් දැක්වීම සහ සූදානම්වීම
- **නිර්මාණශීලී බව සහ නව්‍යතාවයන් දිරි ගැන්වීම**
  සියළුම ක්ෂේත්‍රයන් අඛණ්ඩව වැඩි දියුණු කිරීම සඳහ නව අදහස් උත්පාදනය කිරීම

කොළඹ 2
නො 27 වොක්ෂෝල් වීදිය
සතොස මහලේකම් ගොඩනැගිල්ල
2වන මහල

2013.09.25

ගරු අමාත්‍යතුමා
සමුපකාර හා අභ්‍යන්තර අමාත්‍යාංශය
කොළඹ 2

ගරු ඇමතිතුමණි

**වාර්ෂික වාර්තාව - 2012**

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර 2012 වසර සඳහා වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් ගිණුම් සහ විගණකාධිපතිගේ වාර්තාව මේ සමග ඔබ වෙත ඉදිරිපත් කරමි.

ඔබේ විශ්වාසී

රූමි මර්ෂුක්
සභාපති
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

# වාර්ෂික වාර්තාව - 2012

## **පටුන**


| | | පිටුව |
|---|---|---|
| 1. | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය .................................. | 8 |
| 1.1 | හැඳින්වීම ........................................................................ | 8 |
| 1.2 | සංයුතිය ........................................................................ | 8-9 |
| 1.3 | සේවක මණ්ඩලය ..................................................................... | 10 |
| 1.4 | පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව ...................................... | 10 |
| 2. | අධිකාරියේ අරමුණු ......................................................... | 11 |
| 3. | කාර්යභාරය .......................................................... | 12-13 |
| 4. | අධිකාරියේ කාර්ය සාධනය = 2012 .................................. | 14-33 |
| 6. | 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන ......... | 34 |
| 7. | 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන .................................... | 35-36 |
| 8. | 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රවාහ ප්‍රකාශන.................................... | 37-46 |
| 9. | 2012 දෙසැම්බර් 31 දිනට අවසන් වසර සඳහා විගණකාධිපතිගේ වාර්තාව ........................................................... | 47-58 |
| 10. | විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස් දැක්වීම .................................. | 59-70 |

# 1. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## 1.1 හැඳින්වීම

1979 අංක 1 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත සහ 1987 අංක 1 දරණ සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත සහ 1950 මිළ පාලන පනත අහෝසි කරමින් 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී.

පනතේ පූර්විකාව අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සමස්ත අරමුණ වනුයේ වෙළෙඳාම සහ භාණ්ඩ හා සේවා මිළ ගණන් විධිමත් කිරීම තුළින් පාරිභෝගිකයා වඩාත් හොඳින් ආරක්ෂා කිරීම, අසාධාරණ සහ සීමිත වෙළෙඳ පිළිවෙත් වලට එරෙහිව වෙළෙඳුන් සහ නිෂ්පාදකයන් ආරකෂා කිරීමයි. තවද, හැකි සෑම අවස්ථාවකදීම තරඟකාරී මිළ ප්‍රවර්ධනය කිරීම, භාණ්ඩ හා සේවා වෙළෙන්දන් හා නිෂ්පාදකයන් අතර යහපත් තරඟයක් පවත්වා ගැනීමත් අපේක්ෂා කෙරේ.

## 1.2 අධිකාරියේ සංයුතිය

පනතේ විධිවිධාන ප්‍රකාර, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සහ පනතේ නිශ්චිත වශයෙන් සඳහන් කර ඇති සුදුසුකම් හා පළපුරුද්දක් ලත් සභාපතිවරයෙකුගෙන් සහ තවත් සාමාජිකයන් 10 දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් අධිකාරිය සමන්විත වේ.

**අධිකාරියේ සාමාජිකයින් - 2012**

| | | |
|---|---|---|
| රූමි මර්ෂුක් මහතා | = | සභාපති |
| මිල්ටන් අමරසිංහ මහතා | = | පූර්ණ කාලීන සාමාජික |
| සුනිල් ජයවීර මහතා | = | පූර්ණ කාලීන සාමාජික |
| මේජර් ජෙනරාල් නිමල් ඒ ජයසූරිය මහතා | = | පූර්ණ කාලීන සාමාජික |
| පූජ්‍ය රූකව ජිනරතන හිමි | = | සාමාජික |
| මේජර් ජෙනරාල් පී චන්ද්‍රවංශ මහතා | = | සාමාජික |
| චන්ද්‍රා ඒකනායක මිය | = | භාණ්ඩාගාර නියෝජිත |
| සුගත් මොහාන් ෆ්‍රෑන්ක් ද සිල්වා මහතා | = | සාමාජික |
| දූෂාන් සෝසා මහතා | = | සාමාජික |
| ඒ ජී පී කිත්සිරි මහතා | = | අමාත්‍යාංශ නියෝජිත |
| විනෝද් ධන්සිංගානි මහතා | = | සාමාජික |
| ජේ එම් ජයතිලක ජයසුන්දර මහතා | = | සාමාජික |
| වරුණ අලව්ව මහතා | = | සාමාජික |
| අනුර ප්‍රනාන්දු මහතා | = | සාමාජික |
| අනිල් කුමාර සේනාධීර මහතා | = | සාමාජික |
| එච් එම් එල් හේමන්ත බණ්ඩාර මහතා | = | සාමාජික |
| බැසිල් වැන්ලන්ගන්බර්ග් මහතා | = | සාමාජික |
| ඩබ් ඒ සී හේමකුමාර මහතා | = | සාමාජික |
| ආර් බී තෙන්නකෝන් මහතා | = | සාමාජික |
| මේජර් වයි එච් පී එන් වයි සේනාධිපති මහතා | = | සාමාජික |
| එම් බී එම් ඊබ්‍රහිම් මහතා | = | සාමාජික |
| මාධව සංජීව වත්තේගම මහතා | = | සාමාජික |
| වෛද්‍ය ජයන්ත බලවර්ධන මහතා | = | සාමාජික |
| එම් එච් එෆ් ෂෙරිෆ් මහතා | = | සාමාජික |
| පින්සිත් අමිල පෙරේරා මහතා | = | සාමාජික |
| එම් එන් පී ගුණරත්න මිය | = | අමාත්‍යාංශ නියෝජිත |
| කේ ඩී ඩී කේ ද ආබෲ මහතා | = | සාමාජික |

1.3 අධිකාරියේ සේවක මණ්ඩලය

රූමි මර්ෂුක් මහතා සභාපතිවරයා ලෙස 2012 වර්ෂය තුළදී අඛණ්ඩව සේවය කරන ලදී. චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය (අධ්‍යක්ෂිකා = පාරිභෝගික කටයුතු හා තොරතුරු) අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි 2012 මැයි මස තෙක් වැඩ ආවරණය කළ අතර, චන්ද්‍රරත්න පල්ලේගම මහතා (ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි පළමු පන්තිය) අධ්‍යක්‍ෂ ජනරාල් වරයා ලෙස 2012 මැයි මස 22 දින සිට ද්විතීය පදනම මත පත් කළ අතර, නොවැම්බර් මස 01 දින සිට ඔහුට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ලේකම් වරයා ලෙස වැඩ භාර ගැනීමට සිදු වූ නිසා 2012 දෙසැම්බර් මස 03 දින සිට ජේ එම් ඒ ඩග්ලස් මහතා (ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි පළමු පන්තිය) අධ්‍යක්ෂ ජනරාල් වරයා ලෙස ද්විතීය පදනම මත පත් කරන ලදී.

**අධිකාරියෙහි අංශ භාර ප්‍රධානීන්**

දීප්ති තිසේරා මහත්මිය = අධ්‍යක්ෂිකා (අනුකූලවීම් සහ බලගැන්වීම්)

[M.PA. (PIM-Sri J, Attorney at Law]

චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය = අධ්‍යක්ෂිකා(පාරිභෝගික කටයුතු හා තොරතුරු)

[B.Sc Agri (Sp) M.Sc (Mgt)]

ශාන්තිනී තිරුනීලකන්දන් මහත්මිය = අධ්‍යක්ෂිකා (තරඟකාරීත්ව ප්‍රවර්ධන)

[ACEA]

ඩබ් එම් ප්‍රියන්ත මහතා = අධ්‍යක්ෂ (මුදල්)

[MPM, B.Com (Sp) Hons, AIPFM, DPFM]

සම්පත් අහුළුගහ මහතා = අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)

[B.Com (Sp) Hons, AIPM (SL), Dip in PM]

2012 වසරේදී ද රොහාන් මීවනගේ මහතා අධ්‍යක්ෂ (මිළ කිරීම් හා කළමණාකරන) තනතුරෙහි රාජකාරීන් ඉටු කිරීම සිදු කරන ලදී.

1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

පනතේ iv වන කොටසේ විධි විධාන ප්‍රකාරව පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පිහිටුවා ඇත. නීතිඥ උපාලි සේනාරත්න මහතා 2009.02.11 දින පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සභාපති ලෙස ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා විසින් පත් කරන ලදී. පසුව පැවති ඇමති මණ්ඩල සංශෝධනයෙන් නැවතත් ඔහු 2010 මැයි මස 20 දින සිට වසර 03ක කාලයක් සඳහා ගරු ජොන්ස්ටන් ඇමතිතුමා විසින් පත් කරනු ලදුව 2012 වසරේදීද නොකඩවා ඔහු සභාවේ සභාපති ලෙස කටයුතු කරන ලදී.

**පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සාමාජිකයන් - 2012**

| | | |
|---|---|---|
| නීතිඥ උපාලි සේනාරත්න මහතා | = | සභාපති |
| වසන්ත ගුණවර්ධන මහතා | = | සාමාජික |
| සුදත් විජේවික්‍රම මහතා | = | සාමාජික |

**සභාවේ ලේකම්**

ලේඛා ආර්යරත්න මෙය (නීතිඥ)

## 2. අධිකාරියේ අරමුණු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත ප්‍රකාරව අධිකාරියෙහි අරමුණු පහත පරිදි වේ.

- පාරිභෝගිකයින්ගේ ජීවිත සහ දේපළවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම

- අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම.

- හැකි සෑමවිටම, පාරිභෝගිකයින්ට, තරඟකාරී මිළකට භාණ්ඩ හා සේවා වලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබාදීමට සහතික වීම.

- අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදු කරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහන ලබාදීම

## 3. කාර්යභාරය

අධිකාරියේ කර්තව්‍යයන් පහත පරිදි විදහා දැක්විය හැකිය:

අ.

(1) ව්‍යවසායයන් අතර සීමාකාරී ගිවිසුම්

(2) ව්‍යවසායයන් අතර මිළ පිළිබඳ වැඩ පිළිවෙලවල්

(3) වෙළෙඳපොළ ඇතුලත හෝ වෙළෙඳපොළේ සැලකිය යුතු කොටසක දේශීය වෙළෙඳාම හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ වූ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදා ගැනීම හෝ

(4) දේශීය හෝ ජාත්‍යන්තර වෙළෙඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරඟකාරීත්වය පිළිබඳ යම් අවහිරයක්පාලනය කිරීම හෝ ඉවත් කිරීම

ආ. තරඟ විරෝධී චර්යා හා ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදාගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂණ සිදු කිරීම

ඇ. භාණ්ඩ සහ සේවා සපයන තැනැත්තන් අතර ඵලදායි තරඟකාරීත්වය පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම

ඈ. භාණ්ඩ හා සේවා වල මිළ, ඒවා ලබා ගත හැකි වීම සහ ඒවායෙහි තත්වය සහ සපයන වර්ගය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, මිළදී ගන්නන්ගේ සහ භාණ්ඩ හා සේවා භාවිතා කරන අයගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම

ඉ. මිළදී ගැනීමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්ත්වය, ප්‍රමාණය, ශක්තිය, පිරිසිදුකම, ප්‍රමිති සහ මිළ පිළිබඳව පාරිභෝගිකයින් දැනුවත් කිරීම

ඊ. මෙම පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම

ඌ. වෙළෙඳපොළ තරඟකාරිත්වය අඩු ඵලදායීතාවෙන් පවතින අවස්ථාවලදී වෙළෙඳපොළෙහි තරඟකාරී මිළ ප්‍රවර්ධනය කිරීම

ඍ. වෙළෙඳපොළ තත්ත්වය සහ පාරිභෝගික කටයුතුවලට අදාලව අධ්‍යයන භාර ගැනීම, වාර්තා පළකිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම

එ. රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ කාර්යක්‍ෂමතාව පිළිබඳ අධ්‍යයන භාර ගැනීම

ඒ. පාරිභෝගිකයින්ගේ මනා සෞඛ්‍යය, ආරක්‍ෂාව සහ සුරක්‍ෂිතභාවය සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම

ඔ. වෙළෙඳපොළ තත්ත්වය සහ පාරිභෝගික කටයුතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමඟ හුවමාරු කර ගැනීම ප්‍රවර්ධනය කිරීම

ඕ. පාරිභෝගික සංවිධාන පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම, උපකාර කිරීම සහ උනන්දු කිරීම

ක. අධිකාරිය විසින් ලබා දෙනු ලබන යම් සේවාවක් සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම

ග. අධිකාරියේ කර්තව්‍යයන් ඉටු කිරීමේ පහසුකම් සැලැස්වීමට අවශ්‍ය විය හැකි පරිදි කිසියම් ආකාරයක කමිටුවක් හෝ කමිටු පත් කිරීම, සහ

ච. අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ අධිකාරියේ කර්තව්‍යය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියළු කටයුතු කිරීම

## 4. අධිකාරියේ කාර්ය සාධනය

ආයතන සැලැස්ම අනුව අධිකාරිය අධ්‍යක්ෂකවරු 6 දෙනෙක් යටතේ අංශ 6කින් සමන්විත වන අතර, අභ්‍යන්තර විගණන අංශය සභාපතිතුමන් යටතේ පාලනය වේ. එම අංශ වනුයේ:-

- අනුකූලතා හා බලගැන්වීම්
- පාරිභෝගික කටයුතු සහ තොරතුරු
- මිළකිරීම් සහ කළමණාකරන
- තරඟකාරීත්ව ප්‍රවර්ධන
- මුදල්
- මානව සම්පත් හා පරිපාලන
- අභ්‍යන්තර විගණන

**2012 වසරේදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්‍ය සාධනය පහත පරිදි වේ.**

1. උපද්‍රවකාරී සහ ප්‍රමිතියෙන් තොර භාණ්ඩ හා සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම

අ. පනතේ 10 සහ 12 වගන්ති යටතේ නිකුත් කරන ලද විධාන -

**විධාන අංක 39 -** ප්ලාස්ටික්, ඝන කඩදාසි හෝ දැව වලින් සකසා ඇති ඇසුරුම් දේශියව නිෂ්පාදිත තෝරා ගත් එළවළු සහ පළතුරු රැස් කිරීම, ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කිරීම

මෙය නිකුත් කරන ලද්දේ එලවළු සහ පළතුරු වර්ග 21ක අස්වනු නෙලීමෙන් පසු සිදුවන නාස්තිය වැලැක්වීම සඳහායි. තක්කාලි, තිබ්බටු, කැරට්, කරවිල, තුඹ කරිවිල, මල්ගෝවා, බෙල් පෙපර්, සලාද කොළ, නිවිති, මාළු මිරිස්, පිපිඤ්ඤා, පැපොල්, පේර, අලිගැට පේර, දොඩම්, දෙළුම්, මිදි, පෙයාර්ස්, මැංගුස්ටීන්, ස්ට්‍රෝබෙරි සහ පැෂන්ෆෲට් එම එළවළු සහ පළතුරු වර්ග වේ,

**විධාන අංක 40** - ගෘහස්ත භාවිතය සඳහා පාවිච්චි කරනු ලබන ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායුව අඩංගු වානේ සිලින්ඩර සහ ඊට අදාල උපාංග සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිතියට අනුකූල වීම

මෙම විධානය හඳුන්වා දෙන ලද්දේ ගෘහස්ත භාවිතය සඳහා පාවිච්චි කරනු ලබන ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු අඩංගු වානේ සිලින්ඩර සහ ඊට අදාල උපාංග සඳහා ප්‍රමිතිය පවත්වාගෙන යාම සඳහාය.

**විධාන අංක 41 -** පෙට්ටි වල අසුරන ලද ආරක්ෂිත ගිණිකූරු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිතිය

පෙට්ටි වල අසුරන ලද ආරක්ෂිත ගිණිකූරු සඳහා තත්වය සහ ආරක්ෂිත භාවය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ලාංඡනය තිබීම අනිවාර්ය කිරීම

**විධාන අංක 42 -** සියළුම ඖෂධ හා විටමින් වර්ග වල ඇසුරුම හෝ බහාලුම හෝ ඒකකය මත පැහැදිලිව හඳුනා ගැනීම සඳහා තිබිය යුතු තොරතුරු පිළිබඳ නියෝග පැනවීම

සියළුම ඖෂධ හා විටමින් වර්ග වල ඇසුරුම හෝ බහාලුම හෝ ඒකකය මත පැහැදිලිව හඳුනා ගැනීමට යොදන විස්තර එනම්, උපරිම සිල්ලර මිළ, කාණ්ඩ අංකය, නිෂ්පාදිත දිනය, කල් ඉකුත් වීමේ දිනය, ප්‍රබලතාව සහ නිෂ්පාදකයාගේ සහ/ ආනයනකරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සලකුණු කිරීමෙන් පාරිභෝගිකයා එම භාණ්ඩය මිළදී ගැනීමට පෙර එවැනි විස්තර දැන ගැනීමට සැලසීම

**විධාන අංක 43 -** සියළුම ඖෂධ හා විටමින් වර්ග නිෂ්පාදනය කරන්නන් හා ආනයනය කරන්නන් විසින් දැනට පවත්නා සිල්ලර විකුණුම් මිළෙහි යම් සංශෝධනයක් තිබේ නම් සංශෝධනය කිරීමට පෙර ඒ පිළිබඳව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට දැනුම් දීම

මෙම විධානය නිකුත් කරන ලද්දේ ඒකාකාරී මිළ ව්‍යුහය පවත්වා ගෙන යාම සඳහායි

**ආ. ප්‍රමිතියෙන් තොර ආනයනික භාණ්ඩ අධීක්ෂණය කිරීම**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා ශ්‍රී ලංකා රේගුව සමග සහයෝගීත්වයෙන් ප්‍රමිතියෙන් තොර භාණ්ඩ රට තුලට ඇතුළු වන ස්ථානයේදීම නැවැත්වීමට පියවර ගෙන ඇත. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ආනයන සුපරීක්ෂණ යෝජනා ක්‍රමය පරීක්ෂාවට භාජනය වී නැවත අපනයනය කළ යුතු බවට රෙකමදාරු කරන ලද ප්‍රමිතියට අනුකූල නොවන භාණ්ඩ 146ක් පිළිබඳ පසු විපරම් සිදු කර ඇත.

**ඈ. පාරිභෝගිකයින් ආරක්‍ෂා කිරීම සඳහා ජාතික කමිටු නියෝජනය කරමින් ප්‍රතිපත්ති / නීති සම්පාදනය කිරීමට දායක විය.**

සෞඛ්‍ය අමාත්‍යාංශය, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික කවුන්සිලය නියෝජනය කරමින් සහ පාරිභෝගිකයා ආරක්‍ෂා කිරීමට ප්‍රතිපත්තීන් සහ නීති සම්පාදනය කිරීම.

**2. ප්‍රයෝගාත්මක සහ අසාධාරණ වෙළෙඳ චර්යාවන්ගෙන් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම**

**ව්‍යාපාරික ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන්**

අ. තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා විවේචනයට ලක් විය හැකි කණ්ඩායම් ආරක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම සහ බලය පැවරීමෙන් නාගරික සමාජය සමඟ දැනුවත් කිරීම මගින් වෙළෙඳ ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් සහ ප්‍රජාවට සමීප වූ වැඩ සටහන් ආදිය වැඩිපුර යෝග්‍යය වේ.

2012 වසරේදී අධිකාරිය විසින් මෙවැනි වැඩ සටහන් 183ක් වෙළෙඳ ප්‍රජාව සඳහා පවත්වා ඇත.

2012 වසරේදී වෙළෙඳුන් සඳහා පවත්වන ලද වැඩ සටහන් වගුව 1 පරිදි වේ.
වගුව = අංක 1

| දිස්ත්‍රික්කය | පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 22 | 1,807 |
| පුත්තලම | 01 | 11 |
| මාතර | 110 | 1,466 |
| නුවර එළිය | 06 | 201 |
| වව්නියාව | 01 | 28 |
| යාපනය | 03 | 108 |
| රත්නපුරය | 01 | 25 |
| මාතලේ | 05 | 89 |
| මඩකලපුව | 02 | 80 |
| මහනුවර | 13 | 577 |
| හම්බන්තොට | 01 | 13 |

| දිස්ත්‍රික්කය | පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| අනුරාධපුරය | 01 | 56 |
| ත්‍රිකුණාමලය | 06 | 337 |
| පොලොන්නරුව | 01 | 21 |
| බදුල්ල | 03 | 77 |
| කුරුණෑගල | 01 | 34 |
| කෑගල්ල | 02 | 39 |
| අම්පාර | 02 | 47 |
| ගාල්ල | 01 | 65 |
| ගම්පහ | 01 | 40 |
| **එකතුව** | **183** | **5,121** |

**ආ. වෙළෙඳපොල සුපරීක්ෂාකාරීව නිරීක්ෂණයට භාජනය කිරීම**

ගරු අමාත්‍යතුමා විසින් යම් භාණ්ඩයක් හෝ සේවාවන් හෝ එයින් කොටසක් හෝ ප්‍රජාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය යැයි අදහස් කළවිට අධිකාරියේ අදහස් විමසා එම භාණ්ඩ සහ සේවාවන් නිශ්චිත භාණ්ඩ සහ සේවාවන් ලෙස සලකා ගැසට් පත්‍රයක් ප්‍රසිද්ධ කරයි.

පහත සඳහන් භාණ්ඩයන් නිශ්චිත භාණ්ඩ ලෙස ලැයිස්තු ගත කර ඇත.

- සිමෙන්ති
- එල් පී ගෑස්
- කිරිපිටි
- සහල්
- කුකුල් මස්
- තිරිඟු පිටි
- සුදු සීනි
- වියළි මිරිස්
- ලොකු ළූණු
- රතු ළූණු
- පරිප්පු
- වියළි හාල්මැස්සන්
- කඩල
- මුං ඇට
- ටින් මාළු

කොළඹ සහ අවට ප්‍රදේශවල සිමෙන්ති, එල් පී ගෑස්, කිරිපිටි, කුකුල් මස් සහ සහල් වල මිළ අධීක්ෂණය සහ සුපරීක්ෂාකාරී නිරීක්ෂනය ක්‍රමානුකූලව කර ගෙන යයි.

## ඇ. වෙළෙඳපොල වැටලීම් සහ විමර්ශනය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ අන්තර්ගත කොන්දේසි අනුව දවටනයේ ඇති උපදෙස් උල්ලංඝනය කිරීම, ලකුණු කරන ලද මිළට වඩා වැඩි මිළකට විකිණීම, භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ සන්තකයේ තබා ගෙන විකිණීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ සඟවා තබා ගැනීම, අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව භාණ්ඩ වල තොග සහ සිල්ලර මිළ වැඩි කිරීම, මිළ ලැයිස්තුව ප්‍රදර්ශනය නොකිරීම, මිළදී ගැනුම් සඳහා කුවිතාන්සි නිකුත් නොකිරීම, නිෂ්පාදකයින් / වෙළෙන්දන් විසින් කරනු ලබන නොමග යවන සුළු හෝ රවටන සුළු හැසිරීම සහ ව්‍යාජ නියෝජනයන් ආදිය සඳහා වැටලීම් කරනු ලබයි. වැරදි කරන වෙළෙන්දන්ට විරුද්ධව අදාල මහේස්ත්‍රාත් උසාවිවල නඩු පැවරීම සහ දඩ මුදල් නියම කිරීම පනතේ අංක 60 වගන්තියේ කොන්දේසි අනුව සිදු කරයි.

2012 අවුරුද්ද තුළ අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාල වල විමර්ශන නිලධාරීන් විසින් වෙළෙඳපොල වැටලීම් 27,746ක් සිදු කර ඇත. පනතේ විධි විධාන උල්ලංඝනය කිරීම සම්බන්යෙන් කුට වෙළෙන්දන්ට විරුද්ධව පනතේ අන්තර්ගත කොන්දේසි කඩකිරීම නිසා උසාවි වලින් රු මිලියන 92.1ක ප්‍රමාණයක් දඩ මුදල් ලෙස නියම කර ඇත.


වෙළෙඳපොල වැටලීම් සහ උසාවි මගින් නියම කරන ලද දඩ මුදල් පහත වගු අංක 2 පරිදි වේ.


**වගු අංක = 2**

වෙළෙඳපොල වැටලීම් **සහ** නියම කරන ලද දඩ මුදල් පිළිබඳ ප්‍රගතිය

| මාසය | වැටලීම් |
|---|---|
| ජනවාරි | 3650 |
| පෙබරවාරි | 3318 |
| මාර්තු | 2958 |
| අප්‍රේල් | 2660 |
| මැයි | 2934 |
| ජුනි | 2027 |
| ජූලි | 1976 |
| අගෝස්තු | 1203 |
| සැප්තැම්බර් | 1437 |
| ඔක්තෝබර් | 2224 |
| නොවැම්බර් | 1843 |
| දෙසැම්බර් | 1516 |

| මාසය | රුපියල් 000 |
|---|---|
| ජනවාරි | 11,708 |
| පෙබරවාරි | 9,048 |
| මාර්තු | 11,390 |
| අප්‍රේල් | 3,618 |
| මැයි | 8,970 |
| ජුනි | 7,965 |
| ජූලි | 6,150 |
| අගෝස්තු | 6,794 |
| සැප්තැම්බර් | 6,146 |
| ඔක්තෝබර් | 7,738 |
| නොවැම්බර් | 7,369 |
| දෙසැම්බර් | 5,206 |


2012 වර්ෂය තුළ දී මෙහෙයවනු ලැබූ වෙළෙඳපොළ වැටලීම්
වැටලීම් ගණන
4000
3500
3000
2500
2000
1500
1000
500
0
3650
3318
2958
2660
2934
2027
1976
1203
1437
2224
1843
1516
ජනවාරි
පෙබරවාරි
මාර්තු
අප්‍රේල්
මැයි
ජුනි
ජූලි
අගෝස්තු
සැප්තැම්බර්
ඔක්තෝබර්
නොවැම්බර්
දෙසැම්බර්
මාසය


2012 වර්ෂය තුළ දී අධිකරණය මගින් පණවනු ලැබූ දඩ මුදල්
රු. '000
14,000
12,000
10,000
8,000
6,000
4,000
2,000
0
11,708
9,048
11,390
3,618
8,970
7,965
6,150
6,794
6,146
7,738
7,369
5,206
ජනවාරි
පෙබරවාරි
මාර්තු
අප්‍රේල්
මැයි
ජුනි
ජූලි
අගෝස්තු
සැප්තැම්බර්
ඔක්තෝබර්
නොවැම්බර්
දෙසැම්බර්
මාසය

| ක්‍රියාවට නංවන ලද ක්‍රියාකාර කම් | වැටලීම් සංඛ්‍යාව | පවරන ලද නඩු සංඛ්‍යාව | නියම කරන ලද දඩ මුදල රු. |
|---|---|---|---|
| වෙළෙඳපොල වැටලීම් සහ විමර්ශන<br><br>▪ වගන්ති අංක 10 යටතේ වෙළෙඳපොල විමර්ශන (වගන්ති අංක 10 යටතේ නියෝග කඩ කිරීම | 4,758 | 4,269 | 15,330,250 |
| ▪ වගන්ති අංක 11 යටතේ වෙළෙඳපොල විමර්ශන (ලකුණු නරන ලද මිළට වඩා වැඩි මිළට භාණ්ඩ විකිණීම) | 3,659 | 3,713 | 13,327,600 |
| ▪ වගන්ති අංක 12 යටතේ වෙළෙඳපොල විමර්ශන (ප්‍රමිතියට අනුකුල නොවීම) | 170 | 145 | 687,500 |
| ▪ වගන්ති අංක 15 යටතේ වෙළෙඳ පොල විමර්ශන | 7 | 5 | 14,500 |
| ▪ වගන්ති අංක 16 යටතේ වෙළෙඳ පොල විමර්ශන (භාණ්ඩ සන්තකයේ තබා ගෙන විකිණීම ප්‍රතික්ෂේප කිරීම) | 10 | 7 | 30,000 |
| ▪ වගන්ති අංක 17 යටතේ වෙළෙඳ පොල විමර්ශන (භාණ්ඩ සඟවා තබා ගැනීම) | | | |
| ▪ වගන්ති අංක 18 යටතේ වෙළෙඳ පොල විමර්ශන (උපරිම සිල්ලර මිළ කඩ කිරීම) | 16 | 35 | 156,000 |
| ▪ වගන්ති අංක 20 යටතේ වෙළෙඳ පොල විමර්ශන | 1,204 | 950 | 2,931,550 |
| ▪ වගන්ති අංක 26 යටතේ වෙළෙඳ පොල විමර්ශන (මිළ ලැයිස්තුව ප්‍රදර්ශනය නොකිරීම) | 9,476 | 9,791 | 29,637,500 |

| ක්‍රියාවට නංවන ලද ක්‍රියාකාරකම් | වැටලීම් සංඛ්‍යාව | පවරන ලද නඩු සංඛ්‍යාව | නියම කරන ලද දඩ මුදල රු. |
|---|---|---|---|
| ▪ වගන්ති අංක 28 යටතේ වෙළෙඳ පොල විමර්ශනය (ගැණුම්කරුවනට වෙළෙන්දා විසින් කුවිතාන්සි නිකුත් නොකිරීම) | 56 | 89 | 380,400 |
| ▪ වගන්ති අංක 30 යටතේ වෙළෙඳ පොල විමර්ශනය (නොමග යවන සුළු හෝ රවටන සුළු පැවැත්ම) | 4,837 | 4,000 | 16,802,150 |
| ▪ වගන්ති අංක 30 සහ 31 යටතේ වෙළෙඳ පොල විමර්ශනය (නොමග යවන සුළු හෝ අසත්‍ය නියෝජන) | 2,543 | 2,277 | 8,456,000 |
| ▪ වගන්ති අංක 31 යටතේ වෙළෙඳ පොල විමර්ශනය (අසත්‍ය නියෝජන) | 1,010 | 945 | 4,346,200 |
| වැටලීම් සහ දඩ මුදල් එකතුව | **27,746** | **26,226** | **92,099,650** |

වැටලීම් හැර උසාවියේ නඩු 65ක් පවරා ඇත. දඩ මුදල් ලෙස රු 746,000.00ක් උපයා ගෙන ඇත.

ඈ. **හඳුනාගත් ආනයනික භාණ්ඩ සඳහා උපරිම සිල්ලර මිළ ක්‍රියාත්මක කිරීම**

හඳුනා ගත් භාණ්ඩ සුළු ප්‍රමාණයක් ආනයනය කරන අවස්ථා වලදී එහි උපරිම සිල්ලර මිළ ලකුණු කිරීම නියම කර එය අධිකළණය කිරීමෙන් දේශීය කර්මාන්ත වලට සාධාරන තරඟකාරීත්වයක් ඇති කිරීම

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 10 වෙනි වගන්තිය අනුව 2007.07.11 දිනැති ගැසට් නිවේදන අංක 1505/15 මගින් සියළුම ආනයනය කරුවන්ට හඳුනා ගත් භාණ්ඩ 5ක් සඳහා රට තුළට එම භාණ්ඩ ආනයනය කිරීමට පෙර මිළ ලකුණු කිරීම සඳහා නියෝග පනවා ඇත. ඒ අනුව, රේගු දෙපාර්තමේන්තුව විසින් ආනයනය කරුවන් වෙත භාණ්ඩ නිදහස් කර ගැනීමට පෙර ඔහු අදහස් කරන උපරිම සිල්ලර මිළ ගණන් සමඟ අධිකාරියට අයදුම් පත් ඉදිරිපත් කිරීමට නියෝගයක් නිකුත් කර ඇත.

පහත සඳහන් භාණ්ඩ පහ (05) ආනයනය කරනු ලබන්නන් විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ඔවුන්ගේ උපරිම සිල්ලර මිළ පිළිබඳ අවධාරණය කර සිටිති. උපරිම සිල්ලර මිළ පදනම් කර ගෙන ශ්‍රී ලංකා රේගුව මගින් තීරු බද්දක් පනවා ඇත. මේවායේ මිළ ගණන් ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශ කල පරිදි වෙළෙඳ පොලෙහි අනුකූලව තිබේදැයි සහතික කර ගැනීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් වෙළෙඳ පොල ක්‍රමානුකූල නිරීක්ෂණය කරනු ලබයි. එම භාණ්ඩ 05 පහත පරිදි වේ.

1. රස කැවිලි
2. චොක්ලට්
3. විස්කෝතු
4. කේක්
5. සබන්

අධිකාරිය වෙත අයදුම් පත් 317ත් ලැබුණු අතර, එම සියළුම අයදුම්පත් සම්බන්ධයෙන් අධිකාරිය ක්‍රියාත්මක වී ඇත.

3. අසාධාරණ වෙළෙඳ චර්යාවන්ගෙන් පීඩාවට පත් පාරිභෝගිකයින් සඳහා සහන සැලසීම

අ. පාරිභෝගික පැමිණිලි මෙහෙයවීම

පාරිභෝගික කටයුතු පිළිබඳ පනතේ 13 සහ 32 වගන්ති වල අන්තර්ගත විධිවිධාන අනුව පාරිභෝගික පැමිණිලි සඳහා අධිකාරිය මැදිහත් වෙයි. ඒ අනුව භාණ්ඩ සම්බන්ධයෙන් ව්‍යංගයෙන් හෝ අන් ආකාරයෙන් ලබා දුන් ප්‍රතිඥාහාරයන් හෝ සහතිකවීමකට අනුකූල නොවන භාණ්ඩ සැදීම/ විකිණීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීමේ හැකියාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සතුය.

2012 වසරේ පාරිභෝගික පැමිණිලි මෙහෙයවීමේ ප්‍රගතිය වගු අංක 3 සහ 4 මගින් දැක්වේ.

**වගු අංක 3 - 2012 වසරේ පාරිභෝගික පැමිණිලි මෙහෙයවීම**

| | |
|---|---|
| ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව | 1603 |
| වෙනත් ආයතන වෙත යොමු කර ඇති පැමිණිලි සංඛ්‍යාව* | 144 |
| වැටලීම් සඳහා සහ අනෙකුත් ක්‍රියා කාරකම් සඳහා යොමු කළ සංඛ්‍යාව * | 755 |
| අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව * | 614 |
| ප්‍රතික්ෂේප කළ පැමිණිලි සංඛ්‍යාව * | 51 |
| සාකච්ඡා පවත්වන ලද පැමිණිලි සංඛ්‍යාව * | 463 |

* මෙම එකතුවට පසුගිය වසරවල අවසන් නොවූ පැමිණිලිද ඇතුලත්ය.

**වගු අංක 4 - පාරිභෝගික පැමිණිලි සඳහා පැවැත්වූ විමර්ශන**

| ක්‍රියාමාර්ගය | සංඛ්‍යාව |
|---|---|
| විමර්ශන සඳහා නියම කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 149 |
| සමථයට පත් කළ විමර්ශන සංඛ්‍යාව | 22 |
| නිකුත් කළ නියෝග සංඛ්‍යාව | 12 |
| පැවැත්වූ සාකච්ඡා (විමර්ශනයට පෙර) | 55 |

වගඋත්තර කරුවන් විසින් අධිකාරිය නිකුත් කරන ලද පාරිභෝගික පැමිණිලි සම්බන්ධ නියෝගයන්ට අනුකූල නොවීම නිසා අධිකාරිය විසින් එම නියෝග බලාත්මක කිරීම සඳහා මහේස්ත්‍රාත් උසාවි වල නඩු 7ක් පවරා ඇත.

## 4. පාරිභෝගික අධ්‍යාපනය සහ සවිබලගැන්වීම

පාරිභෝගික අයිතිවාසිකම් සහ වගකීම්, වර්තමාන පාරිභෝගික නීති, වඩා හොඳ පාරිභෝගික ආචාරධර්ම සහ යහපත් වෙළෙඳ ක්‍රියාකාරම් ආදිය සම්මන්ත්‍රණ, වැඩ මුළු සහ ප්‍රදර්ශන ආදිය තුලින් මහජනයා දැනුවත් කිරීමට සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය යොදා ගනී.

ඉහත සඳහන් වැඩ සටහන් වලට අමතරව, පාරිභෝගික අයිතිවාසිකම් දිනය සමරා පාරිභෝගික කණ්ඩායම් සහ වෙළෙඳ ප්‍රජාව සමඟ උත්සව කටයුතු වල යෙදේ. පාරිභෝගික අයිතිවාසිකම් සහ පනතේ නීති රෙගුලාසි පිළිබඳව දීප ව්‍යාප්ත දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වා ඇත.

පාසැල් සිසුන්, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්, රාජ්‍ය නිලධාරීන්, පාරිභෝගික කටයුතු පිළිබඳ ක්‍රියාකාරීන්, ගෘහනියන් සහ ශ්‍රී ලාංකීය පොදු ජනතාව යනාදි වශයෙන් විවිධ කණ්ඩායම් මූලික කර ගනිමින් පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වනු ලැබූ අතර, 2012 වසර තුළදී එවැනි වැඩ සටහන් 149ක් ක්‍රියාත්මක කිරීමට අධිකාරියට හැකි විය. මෙම වැඩ සටහන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මෙන්ම දිස්ත්‍රික් කාර්යාල මගින්ද පවත්වා ඇත. මෙම වැඩ සටහන් වලට අමතරව, අධිකාරිය ප්‍රදර්ශන සහ වෙළෙඳ සල්පිල් සඳහාද දායක වී ඇත

මහජනතාව සහ පාරිභෝගික සංවිධාන පිහිටුවීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් වල ප්‍රගතිය සහ පාසැල් පාරිභෝගික කව පිහිටුවීම සහ ප්‍රදර්ශන ආදිය වගු අංක 5 සිට 9 දක්වා පෙන්වා ඇත.

**වගු අංක 5 - මහජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන්**


| දිස්ත්‍රික්කය | පැවැත්වූ වැඩ සටහන් සංඛ්‍යාව | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| කොළඹ | 27 | 33,081 |
| ගාල්ල | 02 | 5,070 |
| පුත්තලම | 01 | 4,250 |
| බදුල්ල | 01 | 5,000 |
| අනුරාධපුරය | 3 | 5,675 |
| මාතර | 09 | 2,171 |
| යාපනය | 07 | 1,202 |
| පොළොන්නරුව | 04 | 3,303 |
| ගම්පහ | 01 | 4,500 |
| කුරුණෑගල | 04 | 5,195 |
| රත්නපුරය | 03 | 3,290 |
| කෑගල්ල | 01 | 4,200 |
| මොණරාගල | 01 | 3,500 |
| අම්පාර | 03 | 1,490 |
| හම්බන්තොට | 01 | 2,950 |
| කළුතර | 02 | 4,242 |
| වව්නියාව | 01 | 4,100 |
| මාතලේ | 02 | 4,910 |
| නුවරඑළිය | 01 | 5,000 |
| මඩකලපුව | 02 | 895 |
| මහනුවර | 09 | 5,222 |
| ත්‍රිකුණාමලය | 08 | 4,251 |
| **එකතුව** | **93** | **113,497** |

**වගු අංක 6 - පාරිභෝගික සංවිධාන පිහිටුවීම**

| දිස්ත්‍රික්කය | පිහිටවූ පාරිභෝගික සංවිධාන සංඛ්‍යාව | ලියා පදිංචි කරන ලද සංවිධාන සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 06 | 02 |
| මාතර | 01 | 01 |
| පොළොන්නරුව | - | 01 |
| යාපනය | 01 | - |
| වව්නියාව | 34 | 34 |
| කෑගල්ල | 01 | 01 |
| මඩකලපුව | 07 | 01 |
| රත්නපුරය | 03 | - |
| ගම්පහ | 01 | - |
| ත්‍රිකුණාමලය | 06 | 07 |
| **එකතුව** | **60** | **47** |

### වගු අංක 7 - පාසැල් ළමුන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන්

| දිස්ත්‍රික්කය | පැවැත්වූ වැඩ සටහන් සංඛ්‍යාව | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|
| කොළඹ | 18 | 3,368 |
| ත්‍රිකුණාමලය | 28 | 1,446 |
| නුවරඑළිය | 01 | 50 |
| මාතර | 02 | 361 |
| කුරුණෑගල | 02 | 141 |
| මඩකලපුව | 03 | 112 |
| ගාල්ල | 01 | 300 |
| අම්පාර | 01 | 23 |
| **එකතුව** | **56** | **5,801** |



**වගු අංක 8 - පාසැල් පාරිභෝගික කව පිහිටුවීම**

| දිස්ත්‍රික්කය | පිහිටුවූ පාරිභෝගික කව සංඛ්‍යාව | ලියා පදිංචි කල පාරිභෝගික කව සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 13 | 10 |
| ත්‍රිකුණාමලය | 27 | 21 |
| **එකතුව** | **40** | **31** |

**වගු අංක 9 - ප්‍රදර්ශන**

| ක්‍රියාකාරකම / ස්ථානය | දිනය | අමුත්තන් සංඛ්‍යාව |
|---|---|---|
| දැයට කිරුල 2012 - අනුරාධපුරය | 2012.02.04 - 2012.02.12 | 600,000 |
| මහපොළ ප්‍රදර්ශනය 2012 - ශාන්ත අන්තෝනි පිරිමි පාසැල, කටුගස්තොට | 2012.04.06 - 2012.04.12 | 1,800 |
| නීති සතිය 2012 ප්‍රදර්ශනය | 2012.12.01 | 500 |
| **එකතුව** | | **602,300** |

5. තරඟ විරෝධී චර්යාවන්ගෙන් වෙළෙඳුන් සහ නිෂ්පාදකයන් ආරක්ෂා කිරීම සහ යහපත් තරඟකාරීත්වයක් ප්‍රවර්ධනය කිරීම

අ. තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම

2012 වර්ෂය තුළදී පැමිණිලි 36 ක් ලැබී ඇති අතර එයින් පැමිණිලි 24 ක් අවුරුද්ද තුළ දී අවසන් කර ඇත. පැමිණිලි 03ක් පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව වෙත අවසන් තීරණය සඳහා යොමු කර ඇති අතර, පැමිණිලි 03ක් වැටලීම් සඳහාත් යොමු කර ඇත. ඉතිරි පැමිණිලි 06 විමර්ශන සඳහා යොමු කර ඇත.

**වෙළෙඳ පොල කොටස හඳුනා ගැනීම සහ දත්ත එකතු කිරීම**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙළෙඳ පොල තුල හඳුනා ගත් නිෂ්පාදන සඳහා වෙළෙඳ පොල කොටස ගණනය කරනු ලබයි. එහිදී වෙළෙඳපොල කොටස බෙදී ගොස් ඇති ආකාරය හඳුනා ගනී. වෙළෙඳ පොල තුල ඒකාධිකාරීත්වයක් ඇති වන අවස්ථාවලදී එය පාලනය කිරීම සඳහා වෙළෙඳ පොල කොටස අධ්‍යයනය කිරීම වැදගත් වේ.

**වෙළෙඳපොල පර්යේෂණ**

කෑමට ගන්නා තෙල් වල හඳුනා ගත හැකි තරඟ විරෝධී චර්යා ඇති දැයි පරීක්ෂා කිරීම සඳහා විමර්ශනයක් කරන ලදී.

**කර්මාන්ත පිළිබඳ විශේෂ අධ්‍යයනය**

පහත සඳහන් කර්මාන්ත සඳහා විශේෂ අධ්‍යයනයන් කරන ලදී

- හඳුන්කූරු කර්මාන්තය
- බෝතල් කරන ලද බීමට ගන්නා ජලය
- මෝටර් රථ සහ අමතර කොටස්
- යොදය සහිත කිරිපිටි
- සහල් පිළිබඳ අධ්‍යයන වාර්තාව

## 6. සාධාරණ මිලකරණයක් සහතික කිරීම

අ. නිශ්චිත භාණ්ඩ වල මිළ නියාමනය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ වගන්ති අංක 18, 19 සහ 20 වලින් පැවරී ඇති බලතල අනුව හඳුනාගත් වෙළෙඳ භාණ්ඩ සඳහා වෙළෙඳපොල මිළ ගණන් තීරණය කිරීමට මැදිහත් වෙයි. අධිකාරිය විසින් තෝරා ගත් භාණ්ඩ සඳහා මිළ ස්ථායිකරණය/ නියම කිරීමට ගනු ලැබූ ක්‍රියා මාර්ග පහත වගු අංක 10 පරිදි වේ.

| භාණ්ඩය | ක්‍රියා කාරකම |
|---|---|
| සිමෙන්ති | සිමෙන්ති සමාගම් විසින් කළ ඉල්ලීම් සලකා බලා පනතේ අංක 20 (5) යටතේ ගැසට් නිවේදනයක් මගින් 2012 මැයි මස 03 වෙනි දින සිට පෝට්ලන්ඩ් සිමෙන්ති සහ පෝට්ලන්ඩ් හුණුගල් සිමෙන්ති කිලෝ 50 ඇසුරුමක් සඳහා රු. 785/= සිට රු. 855/= දක්වා සහ පෙදරේරු සිමෙන්ති කිලෝ 50 ඇසුරුමක් සඳහා රු. 735/= සිට රු. 805/= දක්වා මිළ වැඩිකර ඇත. |
| කිරිපිටි | කිරිපිටි සමාගම් විසින් කරන ලද ඉල්ලීම් සලකා බලා යොදය සහිත කිරිපිටි වල උපරිම සිල්ලර මිළ සංශෝධනය කර අධිකාරි පනතේ 20 (5) වගන්තිය අනුව 2012 මැයි 04 දින ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. මිළ ගණන් පහත පරිදි වේ:=<br>ග්‍රෑම් 400 යොදය සහිත කිරිපිටි පැකැට්ටුවක් රු. 325.00<br>කිලෝ 1 යොදය සහිත කිරිපිටි පැකැට්ටුවක් රු. 810.00 |


**ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව**

ද්‍රව පෙට්‍රෝලියම් වායුව ගෙන්වන ප්‍රධාන පෙළේ ආනයනය කරුවන් දෙදෙනෙකු සඳහා දුන් උපරිම සිල්ලර මිළ ගණන් පහත පරිදි වේ. 2007 වර්ෂයේ අවසන් භාගයේ හඳුන්වා දුන් මිළ සූත්‍රයට අනුව මිළ ගණන් ගණනය කර ඇත. 2012 වසරේ කිලෝ ග්‍රෑම් 12.5 ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු සිලින්ඩරයක මිළ ගණන් විධිමත් කිරීම පහත වගු අංක 11 පරිදි වේ.


වගු අංක 11 - 2012 වසරේ කිලෝ ග්‍රෑම් 12.5 ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු සිලින්ඩරයක මිළ ගණන් 2011 වසරේ මිළ ගණන් සමඟ සැසඳීම

| මාසය | 2012 මිළ රුපියල් | | 2011 මිළ රුපියල් | |
|---|---|---|---|---|
| | ලිට්‍රෝ | ලාෆ්ස් | ලිට්‍රෝ | ලාෆ්ස් |
| ජනවාරි | 2,046 | 2,046 | 1,652 | 1,556 |
| පෙබරවාරි | 2,046 | 2,046 | 1,652 | 1,556 |
| මාර්තු | 2,046 | 2,046 | 1,652 | 2,029 |
| අප්‍රේල් | 2,046 | 2,046 | 1,890 | 2,029 |
| මැයි | 2,396 | 2,396 | 1,890 | 1,947 |
| ජූනි | 2,396 | 2,396 | 1,890 | 1,947 |
| ජූලි | 2,246 | 2,246 | 1,890 | 2,050 |
| අගෝස්තු | 2,246 | 2,246 | 2,046 | 2,050 |
| සැප්තැම්බර් | 2,246 | 2,246 | 2,046 | 2,050 |
| ඔක්තෝබර් | 2,246 | 2,246 | 2,046 | 2,050 |
| නොවැම්බර් | 2,246 | 2,246 | 2,046 | 2,050 |
| දෙසැම්බර් | 2,246 | 2,246 | 2,046 | 2.046 |

**2011 සහ 2012 වසර වල කොළඹ නගරය තුල කිලෝ 12.5 ලිට්‍රෝ වෙළෙඳ නාම වායු සිලින්ඩරයක සිල්ලර මිළ**



2011 සහ 2012 වසර වල කොළඹ නගරය තුල කිලෝ 12.5 ලාෆ්ස් වෙළෙඳ නාම වායු සිලින්ඩරයක සිල්ලර මිළ




7.ආයතනික හැකියාවන් පුළුල් කිරීම

අ. සේවක මණ්ඩල වර්ධනය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සේවක සංවර්ධන වැඩ සටහන් හඳුන්වා දෙමින් අධිකාරිය මගින් සපයනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට පියවර ගෙන ඇත. 2012 වසරේදී ක්‍රියාත්මක කරන ලද සේවක සංවර්ධන වැඩසටහන් වල තොරතුරු වගු අංක 12 න් දැක්වේ.

**වගු අංක 12 - සේවක සංවර්ධන වැඩ සටහන් - 2012**

| # | පාඨමාලාවේ නම | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| 1 | වැඩ කිරීමේදී සේවක තෘප්තිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන | 52 |
| 2 | රථ වාහන දෙපාර්තමේන්තුව සහ රථවාහන පොලිසිය මගින් සංවිධානය කළ රියදුරන් සඳහා එක් දින වැඩ මුළුව | 18 |
| 3 | ශ්‍රි ලංකා ප්‍රමිති ආයතනය විසින් සංවිධානය කරන ලද සේවකයන් සඳහා වූ වැඩ මුළුව | 68 |
| 4 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පවත්වන ලද තොරතුරු තාක්ෂණය පිළිබඳ (වෙබ් අඩවිය) පුහුණුවීම් වැඩමුළුව | 01 |
| 5 | කොළඹ නීති විද්‍යාලය විසින් පවත්වන ලද නීති කොන්ත්‍රාත්තුව 2012 කොළඹ සංසදය | 01 |
| 6 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් පවත්වන ලද ගබඩා කළමණාකරනය පිළිබඳ පාඨමාලාව | 01 |
| 7 | සී/ස නිපුනතා සංවර්ධන අරමුදල ආයතනය විසින් පවත්වන ලද ප්‍රසම්පාදක ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුව | 02 |
| 8 | සී/ස නිපුනතා සංවර්ධන අරමුදල ආයතනය විසින් පවත්වන ලද කාර්යාල කළමණාකරනය සහ කාර්යාල පටිපාටිය | 01 |
| 9 | ප්‍රාග් ආයතනය විසින් පවත්වන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිතිය | 03 |
| 10 | ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය විසින් පවත්වන ලද Gender Socialism and Trade Union Actions | 02 |
| | කාර්යාල කාර්ය සහායකයන් හට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් මෙහෙයවන ලද උසස් කාර්යක්ෂම තාවය | 02 |
| | සී/ස නිපුනතා සංවර්ධන අරමුදල ආයතනය විසින් පවත්වන ලද දෙදින ගිණුම්කරණ ප්‍රමිතිකරණයට අනුව මූල්‍ය වාර්තා සැකසීම පිළිබඳ වැඩමුළුව | 04 |
| | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වන ලද Human Resource Development Policies & practices in 21st Century and beyond with Emphasis on Chinese Experience | 02 |
| | ඵලදායිතා වැඩි දියුණුකිරීමේ වැඩසටහන | 54 |
| | ශ්‍රි ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිතීන් | 72 |
| | ඵලදායිතා වැඩි දියුණුකිරීමේ වැඩසටහන | 88 |
| | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ කාර්යභාරය | 65 |
| | ආහාර පාලන පරිපාලන අංශයේ කාර්යභාරය | 60 |
| | ජාතික බුද්ධිමය දේපල ආයතනයේ කාර්යභාරය | 86 |
| | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ කාර්යභාරය | 84 |
| | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පනත සම්බන්ධව උසාවි පිළිවෙත | 85 |
| | **එකතුව** | **760** |

ආ. අධිකාරියේ සේවක මණ්ඩලය ශක්තිමත් කිරීම

වගු අංක 13 - 2012.12.31 දිනට අධිකාරියේ සේවක මණ්ඩල සංයුතිය

| වැටුප් තලය | තනතුර | 19.05.2011 දිනට අනුමත සේවක මණ්ඩලය | 2012.12.31 දිනට සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| HM 2-1 | ජ්‍යෙෂ්ඨ කළමණාකරන | | | |
| HM 1-1 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| | අධ්‍යක්ෂ | 6 | 5 | 1 |
| | සභාවේ ලේකම් | 1 | 1 | 0 |
| MM 1-1 | කළමණාකරන | | | |
| | අභ්‍යන්තර විගනක | 1 | 0 | 1 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 15 | 3 | 8 |
| | සහකාර අධ්‍යක්ෂ | | 4 | |
| | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ - ප්‍රාදේශීය | 9 | 0 | 9 |
| JM 1-1 | කණිෂ්ඨ කළමණාකරන | | | |
| | විගණන නිලධාරි | 2 | 0 | 2 |
| | පද්ධති පාලක | 1 | 0 | 1 |
| | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි | 27 | 0 | 27 |
| | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාත නිලධාරි | 1 | 0 | 1 |
| | ජ්‍යෙෂ්ඨ වෙළෙඳපොල පර්යේෂණ විශ්ලේෂක | 1 | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරි | 2 | 2 | 0 |
| | රහස්‍ය ලේකම් (අධ්‍යක්ෂ ජනරාල්) | 1 | 0 | 1 |
| | රහස්‍ය ලේකම් (සභාපති) | 1 | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ පරිපාලන / මානව සම්පත් නිලධාරි | 1 | 0 | |
| | ජ්‍යෙෂ්ඨ නීති හා බලගැන්වීම් නිලධාරි | 2 | 2 | 0 |
| | ජ්‍යෙෂ්ඨ පිරිවැය නිලධාරි | 1 | 1 | 0 |

| වැටුප් තලය | තනතුර | 19.05.2011 දිනට අනුමත සේවක මණ්ඩලය | 2012.12.31 දිනට සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| MA 5-2 | බලගැන්වීම්/ මෙහෙයුම්/ ව්‍යාපෘති | | | |
| | දත්ත සම්බන්ධීකාරක | 1 | 0 | 1 |
| | සංඛ්‍යාත නිලධාරි | 1 | 0 | 1 |
| | වෙළෙඳපොල පර්යේෂණ විශ්ලේශක | 1 | 0 | 1 |
| | ප්‍රලේඛන නිලධාරි | 6 | 0 | 6 |
| | පුස්තකාලයාධිපති | 1 | 0 | 1 |
| | පිරිවැය නිලධාරි | 15 | 1 | 10 |
| | ගිණුම් නිලධාරි | | 4 | |
| | පරිපාලන නිලධාරි | 5 | 1 | 4 |
| | අනුකූලවීම් සහ බලගැන්වීම් නිලධාරි | 3 | 2 | 1 |
| | විමර්ශන නිලධාරි | 200 | 161 | 39 |
| MA 2-2 | කළමණාකරන සහකාර (තාක්ෂණ) | | | |
| | පොත් තබන්නා | 1 | 0 | 1 |
| MA 1-2 | කළමණාකරන සහකාර (තාක්ෂණ නොවන) | | | |
| | කළමණාකරන සහකාර | 31 | 24 | 7 |
| PL 3 | ප්‍රාථමික මට්ටමේ කුසලතා සහිත | | | |
| | රියැදුරු | 18 | 11 | 7 |
| PL 1 | ප්‍රාථමික මට්ටමේ කුසලතා රහිත | | | |
| | කාර්යාල කාර්ය සහායක | 14 | 12 | 2 |
| | එකතුව | 370 | 237 | 133 |

ඇ. සේවක අභිප්‍රේරණය සහ සුභ සාධනය

සේවකයින්ට ප්‍රසන්න හා සේවය කිරීමට පහසුවන වාතාවරනයක් සැපයීම සඳහා වෛද්‍ය රක්‍ෂණ යෝජනා ක්‍රමය, ආගමික සහ සංස්කෘතික වැඩ සටහන්, සේවක දිරි දීමනා ක්‍රමය, සේවක සංවර්ධන වැඩ සටහන්, සේවකයන් හඳුනා ගැනීම් ආදිය ක්‍රියාත්මක කරන ලදී.

ඈ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සඳහා සංශෝධන

පැහැදිලි කිරීම් සඳහා අවසන් කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

**පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව - 2012**

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සමග ක්‍රියාත්මක වන අතර, අධිකාරිය විසින් සභාව වෙත කරනු ලබන යොමු කිරීම් සහ ප්‍රධාන වශයෙන්ම තරඟ විරෝධී චර්යාවන් ආශ්‍රිත ක්ෂේත්‍රයන් නිශ්චය කිරීම සඳහා පනත මගින් බලය පවරා ඇත. පනතේ විධි විධාන ප්‍රකාර අධික මිළ ගණන්, වෙළෙඳපොල අඩුලුහුඩුකම් සහ වෙළෙඳපොල හැසිරවීම් සම්බන්ධයෙන් ද විමර්ශන කටයුතු සඳහා සභාව වෙත යොමු කෙරේ. අවශ්‍ය අවස්ථාවන්හි දී භාණ්ඩ හා සේවා සැපයිය යුතු උපරිම මිළ ගණන් නිර්දේශ කිරීමට සභාවට බලය දී ඇත.

පැමිණිළි/ යොමු කිරීම්

| පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ වගන්තිය | පැමිණිළි/ යොමු කිරීමේ සංඛ්‍යාව | විසඳුම්/ තීරණ / නිර්දේශයන් |
|---|---|---|
| වගන්ති අංක 38<br>තරඟ විරෝධී චර්යාවන් | 7 | 3 |
| වගන්ති අංක 19<br>උපරිම සිල්ලර මිළ | 4 | 5 |
| වගන්ති අංක 19<br>විෂමාචාර වෙළෙඳ ක්‍රියාවන් | 2 | 3 |

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | 2012.12.31 දිනට ශ්‍රී ලංකා රු. 000' | 2011.12.31 දිනට ශ්‍රී ලංකා රු. 000' |
|---|---|---|
| **වත්කම්** | | |
| ජංගම නොවන වත්කම් | | |
| දේපල, පිරියත සහ උපකරණ | 69,063 | 29,798 |
| ආයෝජන (දිගුකාලීන) | 125,239 | 74,420 |
| මූල්‍ය නොවන අනෙක් වත්කම් (සේවක ණය) | 6,089 | 7,736 |
| විලම්භිත සේවක වියදම ගැලපුම් ගිණුම | 2,350 | 2,656 |
| | 202,742 | 114,610 |
| **විකිණීම සඳහා වෙන්කළ ඇති වත්කම්** | **203,066** | |
| | | |
| **ජංගම වත්කම්** | | |
| භාණ්ඩ ලැයිස්තු / තොග | 1,117 | 1,168 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබීම් | 18,579 | 17,600 |
| අනෙකුත් ජංගම මූල්‍ය වත්කම් | 6,492 | 7,034 |
| රාජ්‍ය ණයගැතියන් | | 21,838 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 9,865 | 23,520 |
| | 36,053 | 71,159 |
| **මුළු වත්කම්** | **239,120** | **185,769** |
| | | |
| **වගකීම්** | | |
| ජංගම වගකීම් | | |
| උපචිත වියදම් | 19,651 | 17,312 |
| ගෙවිය යුතු සහ අනෙකුත් වගකීම් | 3,321 | 4,608 |
| | 22,972 | 21,920 |
| | | |
| ජංගම නොවන වගකීම් | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 17,833 | 14,127 |
| | 17,833 | 14,127 |
| **මුළු වගකීම්** | 40,805 | 36,047 |
| | | |
| **ශුද්ධ මුළු වත්කම්** | **198,315** | **149,723** |
| | | |
| **ශුද්ධ වත්කම්/ හිමිකම්** | | |
| සමුච්චිත අරමුදල | 63,191 | 63,191 |
| විලම්භිත ආදායම | 69,387 | 35,409 |
| සංචිත | 65,736 | 51,124 |
| | 198,314 | 149,723 |
| **මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්** | **198,314** | **149,723** |

අධ්‍යක්ෂ මුදල් | අධ්‍යක්ෂ ජනරාල් | සභාපති

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය**

| | 01.01.2011<br>රු. 000' | 2011<br>රු. 000' | 01.01.2011<br>රු. 000' |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 29,713 | - | 29,713 |
| ආයෝජන - දිගුකාලීන | 52,992 | - | 52,992 |
| මූල්‍ය නොවන අනෙක් වත්කම් (සේවක ණය) | 10,277 | 2,512 | 7,765 |
| විලම්භිත සේවක වියදම | - | (2,512) | 2,512 |
| | 92,982 | - | 92,982 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ ලැයිස්තු / තොග | 446 | - | 446 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබීම් | 7,740 | (242) | 7,982 |
| අනෙකුත් ජංගම මුදල් වත්කම් | 5,985 | | 5,985 |
| රජයේ ණයගැතියන් | 21,838 | - | 21,838 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 39,448 | - | 39,448 |
| | 75,458 | (242) | 75,699 |
| **මුළු වත්කම්** | **168,439** | **(242)** | **168,680** |
| | | | |
| **වගකීම්** | | | |
| ජංගම වගකීම් | | | |
| උපචිත වියදම් | 15,704 | - | 15,704 |
| ගෙවිය යුතු සහ අනෙකුත් වගකීම් | 1,893 | - | 1,893 |
| | 17,597 | - | 17,597 |
| ජංගම නොවන වගකීම් | | - | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 11,564 | - | 11,564 |
| | 11,564 | - | 11,564 |
| මුළු වගකීම් | 29,161 | - | 29,161 |
| | | | |
| **මුළු ශුද්ධ වත්කම්** | **139,278** | **(242)** | **139,520** |
| | | | |
| **ශුද්ධ වත්කම්/ හිමිකම්** | | | |
| සමුච්චිත අරමුදල | 63,191 | - | 63,191 |
| විලම්භිත ආදායම | 37,520 | - | 37,520 |
| සංචිත | 38,567 | (242) | 38,809 |
| | 139,278 | (242) | 139,520 |
| මුළු ශුද්ධ වත්කම්/ හිමිකම් | **139,278** | **(242)** | **139,520** |

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2012 දෙසැම්බර් 31 දිනට විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | 2012.12.31 | 2011.12.31 |
|---|---|---|
| | රු 000' | රු 000' |
| **මෙහෙයුම් ආදායම** | | |
| පුනරාවර්ථන ප්‍රතිපාදන | 159,222 | 161,629 |
| දඩමුදල් ආදායම | 34,529 | 30,850 |
| වෙනත් ආදායම් | 21,717 | 17,213 |
| | 215,468 | 209,692 |
| **මෙහෙයුම් වියදම්** | | |
| සේවක වැටුප් | 116,122 | 109,548 |
| ප්‍රවාහනය | 9,664 | 9,230 |
| සැපයුම් සහ පරිභෝජන භාවිතය | 11,055 | 7,598 |
| නඩත්තු වියදම් | 4,364 | 3,108 |
| ගිවිසුම්ගත සේවාවන් | 39,233 | 36,148 |
| ක්ෂයවීම් | 11,680 | 8,060 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 17,518 | 22,095 |
| මුළු මෙහෙයුම් වියදම් | 209,636 | 195,788 |
| **මෙහෙයුම් කාර්යයෙන් ලද අතිරික්තය/ (ඌණතාවය)** | 5,832 | 13,905 |
| | = | |
| මූල්‍ය පිරිවැය | 128 | 84 |
| මෙහෙයුම් නොවන මුළු වියදම් | 128 | 84 |
| අතිවිශේෂ කාර්යයන්ට පෙර ශුද්ධ අතිරික්තය/ (ඌණතාවය) | 5,704 | 13,821 |
| | | = |
| **ශුද්ධ අතිරික්තය** | 5,704 | 13,821 |
| වෙනත් පරිපූර්ණ ආදායම් | | |
| වත්කම් අපහරණයෙන් ලද ලාභය | 1,061 | |
| වත්කම් ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය | | |
| **මුළු පරිපූර්ණ ආදායම** | 6,766 | 13,821 |

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

| | 2012<br>රු 000' | 2011<br>රු 000' |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාවලින් ලද මුදල් ප්‍රවාහය | | |
| සාමාන්‍ය ක්‍රියාවලින් ලද අතිරික්තය/ හිඟය | 5,704 | 12,618 |
| වත්කම් අපහරණයෙන් ලද ලාභය/ (පාඩුව) | 1,062 | |
| **ගැලපුම් -** | | |
| ක්ෂය වීම් | 11,680 | 8,061 |
| පාරිතෝෂික ප්‍රතිපාදන වැඩිවීම | 3,706 | 2,562 |
| ක්‍රමක්ෂය | 25 | 25 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **22,177** | **23,266** |
| ගෙවිය යුතු වියදම් ඉහලයාම - සටහන 1 | 1,051 | 4,324 |
| අනෙකුත් ජංගම වත්කම් ඉහළයාම - සටහන 11 | 21,404 | (11,692) |
| **මෙහෙයුම් කටයුතු තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **44,632** | **15,898** |
| | | |
| **ආයෝජන කටයුතු තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| පිරියත හා උපකරණ මිළදී ගැනීම | (53,014) | (8,172) |
| පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් | 1,831 | - |
| ආයෝජන ඉහළයාම | (50,819) | (21,428) |
| දිගු කාලීන ණය ඉහළ යාම | 1,952 | (115) |
| **ආයෝජන කටයුතු තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(100,050)** | **(29,715)** |
| | | |
| **මුල්‍ය කටයුතු තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| විලම්භිත ආදායම | 33,978 | (2,111) |
| පාරිභෝගික ආරක්ෂණ අරමුදල / සංචිතය | 7,785 | |
| **මුල්‍ය කටයුතු තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **41,763** | **(2,111)** |
| | | |
| **මුදල් හා මුදල් සමාන ද්‍රව්‍යයන්හි ශුද්ධ ඉහළ යාම/ (පහළ යාම)** | **(13,655)** | **(15,928)** |
| **කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ** | **23,520** | **39,448** |
| **කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | **9,865** | **23,520** |

ගිණුම්කරන සටහන්

## 1. ඒකාබද්ධ තොරතුරු

1.1 1979 අංක 1 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත, 1987 අංක 1 දරණ සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත සහ මිළ පාලන පනත (173 පරිච්ඡේදය) අවලංගු කරමින් 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු අධිකාරිය පනත යටතේ පාරිභෝගික කටයුතු අධිකාරිය පිහිටුවන ලදී.

2011 සැප්තැම්බර් මස 15 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පීඊඩී/58/02 ප්‍රකාර නියාමන නියෝජිතායතන අතර "A" කාණ්ඩයේ වර්ගීකරණය යටතට පාරිභෝගික කටයුතු අධිකාරිය අයත් වේ.

**1.2 මූලික කරතව්‍යය සහ මෙහෙයුම් ස්වභාවය**

අධිකාරියේ මූලික කර්තව්‍යය වනුයේ පාරිභෝගිකයින් ආරක්‍ෂා කිරීම සහ වෙළෙඳාම විධිමත් කිරීමයි.

1.3 2012 වසර අවසන් වන විට අධිකාරියේ සේවකයින් සංඛ්‍යාව 241 කි.

**1.4 වැදගත් කොටස් හිමිකාරිත්වය / හිමිකම්**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාරයෙන් ලබා දෙන අරමුදලින් යැපෙන ආයතනයකි. අධිකාරිය වෙත සෘජුවම ලැබෙන ආදායමක් වූ දඩ මුදල් ආදායමෙන් 1/3 ක මුදල මගින් ඇති කරන ලද අරමුදලේ ශුද්ධ ශේෂය මගින් ද අධිකාරියේ හිමිකම් නිරූපණය කෙරේ.

1.5 අංක BD/356/155/265/IR දරන 2012.07.09 දිනැති මහා භාණ්ඩාගාර ලිපිය අනුව, රජයේ ණයගැති ගිණුම් යටතේ පෙන්වා තිබූ රු. 21,837,974.52 මුදල පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත මුදා හරින ලදී. ඉලක්ක කළ වැටලීම් සහ පාරිභොගික දැනුවත් කිරීම් සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණවත් නොවන බැවින් රු මිලියන 14ක් මෙම මුදලින් වියදම් කරන ලදී.

1.6 වත්කම් ආශ්‍රිත රජයේ ප්‍රදාන සහ මූල්‍ය නොවන ප්‍රදාන සාධාරණ වටිනාකම් යටතේ විලම්භිත ආදායම් වශයෙන් ශේෂ පත්‍රයේ දක්වා ඇත. 2011.12.31 දිනට ශුද්ධ වත්කම් අගය සහ විලම්භිත ආදායමේ වෙනස වූ රු. 6,585,559.00 සංචිත ගිණුමට මාරු කර ඇත.

**2. පොදු ගිණුම්කරන ප්‍රතිපත්ති**

2.1 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිති වලට අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ගිණුම් ප්‍රකාශ පිළියෙල කර ඇත.

2011 දෙසැම්බර් 21 දිනෙන් අවසන් වර්ෂය සඳහා සහ සියළුම කාල පරිච්ඡේද තුළ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, අධිකාරියේ මූල්‍ය ගිණුම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මූල්‍ය ගිණුම් අනුව පිළියෙල කර ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2012.12.31 දිනට පිළියෙල කරන ලද ගිණුම් ප්‍රකාශ පළමු වරට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිති අනුව පිළියෙල කොට ඇත.

2.2 ආයෝජන දේපල, හා පිරියත සැලකිල්ලට ගත් සාධාරන අගයකින් පරිනත වූ මුදල් වත්කම් හැර මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කොට ඇත.

**2.3 දඩ මුදල් ආදායම**

2.3.1 අධිකාරියේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා දඩ මුදල් ආදායම් උපයෝගී කර නොගත් බැවින් ආදායම් ප්‍රකාශන සැකසීමේදි දඩ මුදල් ආදායම සැලකිල්ලට නොගන්නා ලදී. දඩ මුදල් ආදායම පිළියෙල කිරීමේදී අදාල 2011 වසරේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව අධිකාරිය විසින් එකී මුදල් ප්‍රයෝජනයට ගන්නා ලදී. එමනිසා දඩ මුදල් ඉපයීම ආදායමක් වශයෙන් සලකන ලද අතර, දඩ මුදල් ආශ්‍රිත සියළු වියදම් හා ආදායම්, ආදායම් සහ වියදම් ගිණුමේ පෙන්වා ඇත.

2.3.2 පාරිභෝගික අධිකාරියේ වැටලීම් නිලධාරීන් ඉදිරිපත් කරනු ලබන නඩු අංක සහ අදාල අධිකරණය විසින් ඔවුන්ගේ දඩ මුදල් ප්‍රේෂණ සමග ලබා දෙනු ලබන නඩු පිළිබඳ විස්තර නොගැලපෙන අවස්ථාවන් ඇති අතර එම අවස්ථාවලදී එම මුදල් සෘජුව දඩ මුදල් ආදායම ලෙස සටහන් කරනු නොලබයි.

ඒ අනුව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත අනුගමනය කරමින් 2012 දෙසැම්බර් 31 දිනට සංසන්දනාත්මක දත්තයන් සමග මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත වලට පරිවර්තනය කරන්නේ සකසන ලද ප්‍රථම ගිණුම් ප්‍රකාශන 2011 ජනවාරි 01 දිනට සකසන ලද ගිණුම් ප්‍රකාශන වේ.

**2.4 මුදල් වර්ෂය**

අධිකාරියේ මූල්‍ය වර්ෂය ලෙස දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ලිත් වර්ෂය සලකනු ලබයි.

**2.5 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිති පළමු වරට භාවිත කිරීම.**

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පළමු වරට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිති අනුව පිළියෙල කර ඇත. 2011.12.31 දින දක්වා සහ එම දිනෙන් අවසන් වර්ෂ සඳහා රාජ්‍ය ගිණුම්කරන ප්‍රමිති වලට සහ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන් වලට අනුව පාරිභෝගික කටයුතු පිළබඳ අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත.

ඒ අනුව, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිති වලට අනුකූලව 2012 දෙසැම්බර් 31 දිනට හා පසුව, 2011 දෙසැම්බර් 31 දිනට හා එම වර්ෂය අවසානයට සහ එකවර සංසන්දනාත්මක කාලයක් සඳහා දත්ත ගිණුම්කරණ ප්‍රතිපත්ති වල විස්තර කර ඇති පරිදි පිළියෙල කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය තත්ත්වයේ ආරම්භක ප්‍රකාශනය 2011 ජනවාරි 01, අධිකාරිය ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති වලට සංක්‍රමනය වූ දින සිට පිළියෙල කර ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිති 1, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිති වලට පළමු වරට සංක්‍රමනය වූවන්ට සංක්‍රමනය වීමේදී යම් යම් විවර්ජන ප්‍රත්‍යක්ෂණ කිරීමට අවසර දෙයි.

**දේපල, පිරියත සහ උපකරණවල සාධාරණ අගය**

පළමු වර SLFRS අනුගමනය කරන දිනට තෝරාගත් දේපල, පිරියන සහ උපකරණ සඳහා, ඒවායේ සාධාරණ වටිනාකම මිණුම් දණ්ඩක් සේ භාවිතා කළ හැකිය. මෙම විවර්ජන වත්කම්වල පංතිය හෝ ප්‍රභේදය ඒවායේ මිණුම් දණ්ඩක් ලෙස අවධානයට ලක් කිරීම සුදුසු නොවන අතර, දේපල, පිරියන සහ උපකරණ වල අයිතමයක් ලෙස සඳහන් කරයි. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 18 හඳුනා ගැනීමේ මිණුම් ඒකකය නියම නොකරයි. උදා: දේපල, පිරියන සහ උපකරන වල ඇති අයිතමයන් ඒ අනුව හඳුනාගැනීමේ මිණුම් දණ්ඩ යොදා ගැනීමේදී සැලකිල්ලට ගත් වටිනාකමට නිශ්චිත අවස්ථාවක යමක ස්වභාවයේ විනිශ්චය අවශ්‍යය. එමනිසා පළමු වරට SLFRS අනුව ගිණුම් සකසන්නන්ට හෝ එහි සියළුම වත්කම් සඳහා හෝ කොටසක මෙම exception අදාල කර ගත හැකිය.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය 2010 වසරේදී මෝටර් වාහන ප්‍රත්‍යාගණනය සිදු කළ අතර, අවුරුදු 5ක කාලයකට ප්‍රත්‍යාගණනය කිරීම ප්‍රතිපත්තිය වේ. අනෙක් වත්කම් පන්ති ප්‍රත්‍යාගණනය කිරීම ආර්ථික වශයෙන් වාසිදායක නොවේ. එමනිසා අනෙක් පංති වල වත්කම් සඳහා ආර්ථික වාසිය සහ වත්කමේ ස්වභාවය අනුව ඒවා ප්‍රත්‍යාගණනය කිරීම සිදු නොකෙරුණි. එමනිසා සාමාන්‍ය භාවිතයේ පවතින වත්කම් සාධාරණීකරනයට පරිවර්තනය නොකෙරුනි.

## 3. වත්කම් පදනම සහ ඒවායේ අගය තක්සේරු කිරීම

### 3.1 දේපළ, පිරියන සහ උපකරණ

දේපළ, පිරියන සහ උපකරණ පිරිවැය හා ශුද්ධ සමුච්චිත ක්ෂය අගයට සටහන් කර ඇති අතර, ඒවායේ වැඩි දියුණු කිරීමද ඇතුලත් වේ. දේපළ, පිරියන සහ උපකරණ වලට ප්‍රමාණවත් වන කොටස් නැවත එකතු කරන විට වත්කම්වල නව ජීවිත කාලය තක්සේරු කර නැවත නව කොටස් වල අගය තක්සේරු කර සටහන් කරන ලබයි. අළුත් වැඩියා සහ නඩත්තු වියදම් ආදායම් ප්‍රකාශයේ එය වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

ප්‍රත්‍යාගණන අතිරික්තයන් විස්තීර්ණ ආදායමට ගෙන ඇති අතර සමුච්චිත ප්‍රත්‍යාගණන අතිරික්තයන් යටතේ සටහන් කර ඇත.

3.1.2 දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය යනු මිළදී ගත් පිරිවැය හෝ එය අපේක්ෂිත පරිහරණය සඳහා සුදුසු තත්ත්වයකට පත් කිරීමට දරණ ලද යම් වියදමක් ඇතුළුව ඉදිකිරීම් පිරිවැය යනුවෙන් අදහස් කරයි.

3.1.3 ව්‍යාපාර කටයුතු සිදු කරගෙන යාමේ අරමුණින් ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම, වැඩි දියුණු කිරීම සඳහා දරන වියදම් හෝ එකී වත්කම් වල ජීව කාලය ඉහළ නැංවීම සඳහා දරණ ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

3.1.4 අයවැය චක්‍රලේඛ අංක 150 අනුව, 2012 වර්ෂය ආරම්භයේදී පාරිභෝගික කටයුතු අධිකාරියේ වාහන සංචිතය වෙත වාහන 05ක් (ටොයොටා හයිඒස් වෑන් 4ක් සහ ටොයොටා කාරයක්) එක් කරන ලදී. එය ඉන්වොයිස් කරන ලද මිළ වන රු. 48,848,357.00 මුල්‍ය නොවන ප්‍රදානයන් ලෙස ගිණුම් ගත කර ඇත.

**3.2 ක්ෂය වෙන් කිරීම**

සියළුම වත්කම් අධිකාරියේ භාවිතයට යොදා ගත් දිනෙන් ආරම්භ වන මාසයේ සිට ක්ෂය ප්‍රතිපාදන සලකනු ලබයි.

3.2.1 දේපළ, පිරියත සහ උපකරණ ඒවායේ ඇස්තමේන්තුගත ආයු කාලය මත පිරිවැය කපා හැරීමට හැකිවන පරිදි පහත සඳහන් ආකාරයට ක්ෂය ප්‍රතිපාදන සලසා ඇත.

| | |
|---|---|
| කාර්යාලයීය ලී බඩු සහ පිටතින් සවිකිරීම් | 10% |
| කාර්යාලීය සම්භාරය | 10% |
| පරිඝනක සහ උපකරණ | 20% |
| මෝටර් රථ | 20% |
| කාර්යාලීය වෙන් කිරීම් | 20% |
| පරිභෝජනයට නොගත හැකි දේ | 10% |

3.2.2 ක්ෂය ප්‍රතිපාදන ගණනය කිරීමේදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සරල මාර්ග ක්‍රමය අනුගමනය කරයි.

3.2.3 පුස්තකාල පොත් සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසා නොමැත.

3.2.4 වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන විලම්භිත ආදායම් ගිණුමට බැර කෙරේ.

**3.3 ගොඩනැගිලි පරිශ්‍රය - කුරුණෑගල**

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය වෙත පවරා ඇති ගොඩනැගිලි පරිශ්‍රය සඳහා ගෙවනු ලබන රුපියල් මිලියනයක මුදල වර්ෂ 40ක කාලය සඳහා ක්‍රමක්ෂය කර ඇත.

**3.4 ණයගැතියන් සහ ලැබිය යුතු මුදල්**

උපලබ්ධි වීම සඳහා ඇස්තමේන්තු කර ඇති වටිනාකම් මත ණයගැතියෝ සහ ලැබිය යුතු මුදල් සඳහන් කොට ඇත.

3.5 භාණ්ඩ ලැයිස්තු අවම පිරිවැය මත හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම මත අගය කර ඇත.

**3.6 මුදල් සහ ඒ හා සමාන වත්කම්**

මුදල් සහ ඒ හා සමාන වත්කම්, අතේ ඇති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ කෙටි කාලීන ආයෝජන වශයෙන් අර්ථ දැක්වේ.

3.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා, මුදල් සහ මුදල් සමාන දේ යන්නට අතැති මුදල් හා බැංකු තැන්පතු ඇතුළත් වේ.

**3.7 මුදල්**

**3.7.1 මූල්‍යමය උපකරණ**

නිශ්චිත කල් පිරීම සහ නිශ්චිත ගෙවීම සමග කල් පිරීම සඳහා ඇති ආයෝජන ප්‍රභවය ප්‍රභවය නොලත් තත්ත්වය නිසා අධිකාරියේ ස්ථිර තැන්පතු ආයෝජන කල්පිරීමට රඳවා තබා ඇති ආයෝජන ලෙස වර්ගීකරනය කර ඇත. ආරම්භයේදී ස්ථිර තැන්පතු පිරිවැයට සඳහන් කර ඇත. හඳුනාගැනීමෙන් පසුව ස්ථිර තැන්පතු අදාල පොලී ක්‍රමය සහිතව වියදම පිරිවැය ලෙස සලකයි. ස්ථිර තැන්පතුවල සාධාරණ වටිනාකම වෙනස් වීමෙන් ලාභ හෝ පාඩු මතුවන බව ආදායම් ප්‍රකාශයේ එය එම කාලය සඳහා සඳහන් කර ඇත. සාධාරණ වටිනාකම් ගණනය කර ඇත්තේ වට්ටම් අනුපාතිකය ප්‍රයෝජනයට ගනිමින් වාර්ෂික භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතය අනුවය.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පෙර පලපුරුද්ද අනුව කාලසීමාට තුළදී ස්ථිර තැන්පතු ආපසු ගැනීම් නොකළ නිසා බොහෝ ස්ථිර තැන්පතු අඩුම වශයෙන් අවුරුදු **3**ක් ශේෂව පවතී යැයි උපකල්පනය කරයි.

### 3.7.2 පරිණත වන තෙක් ඇති ජංගම නොවන වත්කම්

ජංගම නොවන වත්කම් සහ විකුණන තෙක් රඳවා ගෙන ඇති අපහරන වත්කම්, කපා හල පොත් අගයට හෝ විකිණිය හැකි සාධාරන අගයෙන් විකිණීම සඳහා යන පිරිවැය අඩුකර ලැබෙන මුදල යන දෙකින් අඩු අගයට සටහන් කර ඇත.

## 4. වගකීම් සහ ප්‍රතිපාදන

### 4.1 ගෙවිය යුතු මුදල්

ගෙවිය යුතු මුදල් ඒවායේ පිරිවැය සම සඳහන් කර ඇත.

### 4.2 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිශ්චිත විශ්‍රාමික දීමනා සැලසුම් ක්‍රම දෙකක් ඇති අතර එම දෙකටම දායකත්වය දිය යුතුය.

### 4.2.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පාරිතෝෂිකය

පාරිතෝෂිකය වනාහි නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. අදාල ව්‍යවස්ථාවට අනුකූලව අධිකාරිය පාරිතෝෂික ගෙවීමට බැඳී සිටි. මෙම වගකීම සපුරාලීම සඳහා සේවා කාලයේ පළමු වර්ෂයේ සිට ආරම්භ වී සේවය සපයනු ලබන සෑම වර්ෂයක්ම සඳහා මූල්‍ය වර්ෂයේ අවසන් මස සියළුම සේවකයන්ගේ මාසික වැටුප මත ගණනය කරනු ලබන මුදලට සමාන මුදලක්, ශේෂ පත්‍රය යටතේ ප්‍රතිපාදනයක් ලෙස ඉදිරියට ගෙන එනු ලබයි. වර්ෂය ආරම්භයේදී ඉදිරියට ගෙනා ප්‍රතිපාදන සහ වර්ෂය අවසානයේදී පහළට ගෙන ආ ශේෂය අතර වෙනසක් පැවතියේ නම් එය ආදායම් ප්‍රකාශය මගින් නිරවුල් කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රමිති අංක 16 අනුව, අවම වශයෙන් වර්ෂයක් සම්පූර්ණ කර ඇති සේවකයන් සඳහා පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබයි. මහා භාණ්ඩාගාරය විසින් කලින් අරමුදල් මුදා නොහරින බැවින් පාරිතෝෂික සැලසුම් සම්බන්ධයෙන් කිසිදු මුදලක් අධිකාරිය විසින් ආයෝජනය කර නොමැත.

අවශ්‍ය බැරකම ආයෝජනය නොකළ බැවින්, ඒකාන්ත ලැබීම් හෝ පාඩු හඳුනාගෙන නොමැත. කෙසේ වුවත්, වාර්ෂික භාණ්ඩාගාර බිලපත් වල පොලී අනුපාතයේ වර්තමාන අගය නිශ්චිත යහපත් වගකීම් වල අගය මත වට්ටම් අනුපාතය අඩංගු වේ.

### 4.2.2 නිශ්චිත දායක මුදල් සැලසුම්/ සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව සියළුම සේවකයින් තමන්ගේ සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ලබති. ගෙවනු ලබන දායක මුදල් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස පෙන්වා ඇත.

සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා අධිකාරිය විසින් සේවකයාගේ දළ වැටුපෙන් 15% සහ 3%ක මුදලක් පිළිවෙලින් දායක කරයි.

## 5. ආදායම

### ආදායම් හඳුනාගැනීම

අධිකාරිය වෙත සාධාරණ විශ්වාසයකින් ලැබේයයි අදහස් කරන අපේක්ෂා සහ විශ්වාසදායක ලෙස මිනිය හැකිනම් ඒවා ආදායම ලෙස සලකනු ලබයි.

පොළිය හිමි මූල්‍ය වත්කම් (ස්ථාවර තැන්පතු) කල් පිරීමට ඇති මූල්‍ය වත්කම ලෙස වර්ගීකරණය කර ඇත. පොලී ආදායම ඵලදායි පොලී අනුපාත ක්‍රමය (ELR) අනුව ගණනය කර සටහන් කර ඇති අතර ඒවා සත්‍ය වශයෙන්ම මූල්‍ය වත්කම් වල බලාපොරොත්තුවන ජීවිත කාලය හෝ ඊට අඩු කාලයක් සඳහා ඇස්තමේන්තු කරනු ලැබූ අනාගත මුදල් ලැබීම් පදනම් කර ගෙන වාර්තාකර ඇත. පොලී ආදායම, ආදායම අනාගතයේ මූල්‍ය ආදායම පහතින් සටහන් කර ඇත.

### රජයේ ආධාර

ආධාරය සාධාරණව ලැබේ යයි සත්‍ය ලෙස සලකා සහ එයට අදාල කොන්දේසි අනුකූලව ඇත්නම් එය රජයේ ආධාර ලෙස හඳුනා ගනී. ආධාර වියදම් අයිතමයක් සේ සම්බන්ධයක් ඇත්නම් (පුනරාවර්තන ආධාර) එය එම කාලය සඳහා ආදායමක් ලෙස සලකයි. ආධාර වත්කම් අයිතමයක් සේ සම්බන්ධයක් ඇත්නම් (ආයෝජිත ආධාර) එය කොටස් වශයෙන් එන ආදායමක් ලෙස සලකයි. එමෙන්ම අදාල වත්කමේ බලාපොරොත්තු කාලය තුළ සමාන කොටස් වශයෙන් එය නිදහස් කරයි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුදල් නොවන අධාර ලැබීමේදී, වත්කම සහ ආධාරය වාර්තාගත වන්නේ නාමික ප්‍රමාණ වල දල වශයෙන් සහ ආදායම් ප්‍රකාශයට නිදහස් කරන්නේ වත්කමේ ජීවිත කාලයටයි.

## 2011.12.31 දිනට ස්කන්ද වත්කම හා විස්තීර්ණ ආදායම කල ගැලපුම සඳහන් වන සටහන්

### අ. දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (2011 වර්ෂය) මෝටර් රථ නැවත තක්සේරු කළ මිළ ගණන් වලට රු. 10,622,670/= වටිනාකමේ වෙනස්වීම් සහිතව අවබෝධ කර ගත් ආදායම අඩංගුව ඇත. රු 10,622,670/= වූ ප්‍රත්‍යාගනන අතිරික්තය විලම්භිත ගිණුමට බැර කර ඇත.

### ආ. විලම්භිත ආදායම

මිළදී ගන්නා ලද දේපල, යන්ත්‍ර සහ උපකරණ වල ප්‍රත්‍යාගණනය විලම්භිත ආදායම් ගිණුමට මාරු කරන ලදී. අවුරුද්ද තුළදී නැවත මිළ කිරීම් සහ ක්ෂය වීම් මෙම ගිණුමට බැර කර ඇත. ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව වත්කම් වල විලම්භිත ආදායම
සහ ශුද්ධ වටිනාකම් සමාන විය යුතුය. ඉහත කරුණු නිසා වෙනස්වීමක් පැන නැගුණහොත් එය සංචිත ගිණුමට බැර කරයි.

### ඇ. කල් පිරීම තෙක් තබා ඇති මුදල් වත්කම්

**ස්ථිර තැන්පතු**

ස්ථිර තැන්පුවල වර්තමාන වෙළෙඳ වටිනාකම හඳුනාගෙන ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට අනුව මිස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව නොවේ. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති යටතේ ස්ථිර තැන්පතු දිගු කාලීන ආයෝජන ලෙස නම් කර ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இ / My No. — ටීසී/ට/සීඑච්/එෆ්ඒ/2012    ඔබේ අංකය / உமது இல / Your No    දිනය / திகதி / Date — 2013 ඔක්තෝබර් 31 දින.

සභාපති,
පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 2003 අංක 09 දරන පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපතිවරයා වෙත 2013 සැප්තැම්බර් 16 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව — இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை — No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone — 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. — 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල / ஈ- மெயில் / E-mail. — oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාර්යේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව, වසර 05 කට වරක් සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, 2010 වර්ෂයේ දී මෝටර් වාහන පමණක් ප්‍රත්‍යාගණනය කිරීම හැරෙන්නට සමාලෝචිත වර්ෂය තුළදී රු.30,822,356 ක් වටිනා වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබීම නිසා වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වලින් නිරූපණය වී නොතිබුණි.

(ආ) පාරිභෝගික ආරක්ෂණ අරමුදලෙහි 2012 දෙසැම්බර් 31 දිනට බැර ශේෂයක් ලෙස දැක්වෙන රු.133,374,156 ක්වූ මුදලින් රු.128,570,000 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, ඉතිරි රු.4,804,156 ක මුදල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව. | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.5 (අ) ඡේදය හා 1999 ඔක්තෝබර් 01 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව අධිකාර්යේ නියෝජ්‍ය/වැඩබලන අධ්‍යක්ෂකවරුන් 05 දෙනෙකුට විධිමත් අනුමැතියකින් තොරව 2012 සැප්තැම්බර් 01 සිට රු.7,500 බැගින් වූ මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. |
| (ආ) 2010 දෙසැම්බර් 07 දිනැති අංක බීඩී/ජීපීඑස්/130/9/12 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය | කුලී පදනම මත වාහන ලබා ගැනීම අත්හිටුවා තිබුණු නමුත් 2012 වර්ෂය තුළ එකතුව රු.1,840,000 ක් වැය කර කුලී පදනම මත වාහන 04 ක් ලබාගෙන තිබුණි. 2013 මැයි වන විට අධිකාරිය සතුව සංචිත වාහන 08 ක් පැවතියද, මෙම කුලී වාහන භාවිතයේ පැවතුණි. |

3. මූල්‍ය සමාලෝචනය

------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ වැඩ කටයුතුවලින් වූ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,765,819 අතිරික්තයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.13,821,071 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.7,055,252 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. අධිකාරියේ ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වියදම් රු.195,786,572 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එය රු.209,636,046 ක් වූ වුයෙන් රු.13,849,474 ක එනම් 7% ක වියදම් වල වැඩිවීම ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

4.1 කාර්යසාධනය

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී වැටලීම් හා විමර්ශනයන් 60,588 ක් සිදු කර රු.මිලියන 242.35 ක (අධිකාරියට 1/3 ක් සහ අධිකරණය මගින් රජයේ අදායමට 2/3 ක් ඇතුළුව) ආදායමක් ඉපයීමට අපේක්ෂා කර තිබුණද, වර්ෂය තුළ වැටලීම් හා විමර්ශනයන් 27,746 ක් පමණක් සිදු කර රු.මිලියන 92.09 ක ආදායමක් උපයාගෙන තිබුණි. ඒ අනුව, ඉලක්ක කළ වැටලීම් හා විමර්ශනයන් සිදු කිරීමට හෝ අපේක්ෂා කළ ආදායම ඉපයීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ආ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 18 (1) වගන්තියට අනුව, ප්‍රජාවගේ හෝ එහි යම් කොටසකගේ ජීවිතයට අත්‍යවශ්‍යය වන බව නියම කෙරුණු භාණ්ඩ, නිශ්චිත භාණ්ඩ ලෙස නම් කළ හැකි අතර පනතේ 18 (2) වගන්තියට අනුව, එසේ හඳුනාගත් භාණ්ඩවල සිල්ලර හෝ තොග මිල අධිකාරියේ පූර්ව අනුමැතිය ඇතිව මිස වැඩි කරනු නොලැබිය යුතු වේ. ඒ අනුව, අධිකාරිය විසින් නිශ්චිත ලෙස භාණ්ඩ 15 ක් නම් කර හඳුනාගෙන තිබුණු අතර ඉන් සිමෙන්ති,පෙට්‍රෝලියම්, කිරි ආහාර, සහල් හා කුකුල් මස් වැනි භාණ්ඩ 05 ක් සඳහා පමණක් මිල පාලනයේදී අධිකාරිය මැදිහත් වී තිබුණි. ඉතිරි භාණ්ඩ වල මිල පාලනයකට අධිකාරිය මැදිහත්වීමට කටයුතු කර නොතිබුණි. මිල පාලනය සඳහා තෝරාගත් භාණ්ඩ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

5

(i) කුකුල් මස්

------------

* 2010 පෙබරවාරි 18 දිනැති අංක 1641/48 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් අධිශීතකළ සම සහිත බ්‍රොයිලර් කුකුල් මස් විකිණිය හැකි උපරිම මිලක් පනවා තිබුණද, සම ඉවත් කළ, කොටස් වශයෙන් අලෙවි කරනු ලබන අනිකුත් කුකුල් මස් සඳහා එම නියෝගය බල නොපාන හෙයින් මිල පාලනය අසාර්ථක වී තිබුණි.

* කෙසේ වුවද, 2012 ඔක්තෝබර් 18 දින වනවිට මෙම මිල පාලනය ඉවත් කර තිබුණෙන් මස්වල මිල ගණන් රු.380 සිට රු.450 දක්වා වූ පරාසයකින් මිල ඉහල ගොස් තිබූ බව අධිකාරියේ මිල කළමණාකරණ අංශය මගින් වාර්තා කර තිබුණි. පනතේ 19 (1) වගන්තිය අනුව, මෙම කරුණු විමර්ශනය කර වාර්තා කිරීම සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පාර්භෝගික සභාව වෙත වාර්තා කළ යුතු අතර, පනතේ 19 (2) වගන්තිය අනුව, එම යොමු කිරීමෙන් මාස දෙකක් ඇතුළත සභාව විසින් ස්වකීය වාර්තාව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ii) කිරිපිටි

--------

* සම්පූර්ණ යොදය සහිත කිරිපිටි.

-----------------------------------

සමාගම් 04 ක් විසින් ලාභාන්තික හා බදු ඇතුළත් පිරිවැය ඇස්තමේන්තු ඉදිරිපත් කරමින් කිරිපිටි මිල වැඩි කරන ලෙස කරන ලද ඉල්ලීමට අනුව, 2012 මැයි 04 දිනැති අංක 1756/32 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ග්‍රෑම් 400 කිරිපිටි පැකට්ටුවක සහ කිලෝ ග්‍රෑම් 1 ක කිරිපිටි පැකට්ටුවක මිල පිළිවෙලින් රු.61 කින් සහ රු.163 කින් වැඩි කිරීමට අධිකාරිය විසින් අවසර ලබා දී තිබුණි.

එහිදී එක් එක් සමාගම් ඉදිරිපත් කළ පිරිවැය ඇස්තමේන්තු නොසලකා පොදුවේ එකී සමාගම් මිල වැඩිකිරීමට ඉල්ලන ලද මිලට වඩා වැඩි මිලක් පාලන මිලක් ලෙස නියම කර තිබුණි. මේ නිසා නිෂ්පාදන සමාගම් ග්‍රෑම් 400 කිරිපිටි පැකට්ටුවකින් සහ කිලෝ ග්‍රෑම් 01 ක කිරිපිටි පැකට්ටුවකින් පිළිවෙලින් රු.9 සිට රු.40 සහ රු.47 සිට රු.110 දක්වා වූ ලාභ ආන්තිකයක් අතිරේක වශයෙන් උපයා ගැනීමට ඉඩ දී තිබුණි.

* යොදය රහිත කිරිපිටි.

-----------------------

2003 අගෝස්තු 20 දිනැති අංක 1302/24 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් කිරි ආහාර නිශ්චිත භාණ්ඩයක් ලෙස ප්‍රකාශ කර තිබූ නමුත් යොදය රහිත කිරිපිටි සඳහා අධිකාරිය විසින් පාලන මිලක් නියම කර නොතිබුණි. මේ නිසා නිෂ්පාදකයන් හා බෙදාහරින්නන් අධිකාරියේ අවසරය නොමැතිව තමන්ට අවශ්‍ය පරිදි කිරිපිටි මිල තීරණය කර පවත්වාගෙන ගොස් තිබුණි.

(iii) ළදරු කිරි ආහාර

-------------------

* ඉහත අංක 1302/24 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් කිරි ආහාර නිශ්චිත භාණ්ඩයක් ලෙස නම් කර තිබුණද, 2012 ජුනි 18 දින වන විටත් වර්ෂ 09 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, අධිකාරිය ළදරු කිරි පිටි මිල පාලනය සඳහා මැදිහත් වී නොතිබුණි. එහෙයින් නිෂ්පාදකයන් හා විකුණුම්කරුවන් තම අභිමතය පරිදි ළදරු කිරි පිටි මිල තීරණය කර ක්‍රියාත්මක කර තිබුණි.

* කෙසේ නමුත්, පසුව අධිකාරිය 2012 ජුනි 18 දිනැති අංක 1763/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ළදරු කිරි ආහාර සඳහා මිල පාලනයක් සඳහා මැදිහත්වී තිබුණද, එම මිල පැනවීමද සාධාරණ නොවන බව දක්වමින් අධිකාරියට එරෙහිව එක් සමාගමක් නඩු පවරා තිබුණි.

* කෙසේ වුවද, අධිකාරිය විසින් පාලන මිල තීරණය කිරීමේ දී වෙළඳපොල මිල හා පිරිවැය ඇස්තමේන්තු විශ්ලේෂණය කර නොතිබුණු අතර, ඒ සඳහා උපකල්පන පමණක් භාවිතා කර තිබුණි. මෙම උපකල්පන, පාරිභෝගික සභාව මගින්ද අනුමත කර තිබුණි. ඒ සම්බන්ධව පවරා තිබූ නඩුව සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් අධිකාරිය වෙත දන්වා තිබුණේ සභාව කරුණු නිසි ලෙස විමර්ශණය කර නොමැති බැවින් ඉහත ගැසට් නිවේදනය ඉවත් කර නව ගැසට් නිවේදනයක් නිකුත් කළ යුතු බව දන්වා තිබුණත් නමුත් ඒ අනුව 2013 සැප්තැම්බර් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(iv) සිමෙන්ති මිල

--------------

2006 ඔක්තෝබර් 26 දිනැති අංක 1468/16 දරන ගැසට් පත්‍රය මගින් සියළුම වර්ගවල සිමෙන්ති නිශ්චිත භාණ්ඩයක් ලෙස නම් කර තිබුණද ඉදිකිරීම් සමාගම්වලට නිකුත් කරන සිමෙන්ති තොග(bulk) සඳහා එම මිල අදාල වී නොතිබුණි.

(v) තිරිඟු පිටි

-----------

2004 මැයි 23 දිනැති අංක 1342/11 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් තිරිඟු පිටි නිශ්චිත භාණ්ඩයක් ලෙස නම් කර තිබුණද, නිෂ්පාදකයින් අධිකාරියේ අවසර නොලබා මිල වැඩි කිරීමට කටයුතු කර තිබුණි. නමුත් රජයේ නීතිපතිවරයා විසින් මෙම භාණ්ඩය පාරිභෝගික අධිකාරී පනතේ 18 (2) වගන්තිය අනුව, පාලනය වන්නක් බැවින් මිල වැඩි කිරීමේ දී අධිකාරියේ පූර්ව අනුමැතිය මත සිදුකළ යුතු බව දන්වා තිබූ නමුත් තිරිඟු පිටිවල මිල පාලනය සම්බන්ධව අධිකාරියේ අධිකාර බලය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(vi) ලික්විඩයිට් පෙට්‍රෝලියම් (එල්පී) ගෑස්

----------------------------------------

* 2012 පෙබරවාරි හා මාර්තු මාසවල පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් 1,031 හා එක්සත් ජනපද ඩොලර් 1,195 මට්ටමක පැවති ගෑස් ටොන් 1 ක මිල 2012 අප්‍රේල් සිට අගෝස්තු දක්වා එක්සත් ජනපද ඩොලර් 993 ක් හා එක්සත් ජනපද ඩොලර් 996 ක පරාසයකින් අඩුවී තිබීම පදනමක් ලෙස ගෙන භාණ්ඩාගාරය මැදිහත් වී එල්පී ගෑස් මිල රු.150 කින් අඩුකර තිබුණි. මෙවැනි මිල අඩුවෙන අවස්ථාවලදී අධිකාරිය ඒ සඳහා මැදිහත් වී නොතිබුණි.

* ලිට්රෝ හා ලාෆ් යන සමාගම් 02 ක විසින් 2012 අප්‍රේල් මාසයේ කළ ඉල්ලීමකට අනුව 2012 මැයි 04 දින සිට කිලෝ ග්‍රෑම් 12.5 ක එල්පී ගෑස් සිලින්ඩරයක මිල (කොළඹ මිල) රු.350 කින් වැඩි කිරීමට ඉඩ දී තිබුණි. මිල තිරණය සඳහා ඉහත සමාගම් දෙක විසින් 2012 පෙබරවාරි හා මාර්තු මාස වල ආනයනය කළ ගෑස්වලට අදාල ඉන්වොයිස් පමණක් පදනම් කර ගෙන තිබුණි. නමුත් සමාගම් දෙකම එකම සැපයුම් කරුවෙකුගෙන් මිලදී ගෙන තිබීම, එතෙක් ඔවුන් වෙත තිබූ ඉතිරි එල්පී ගෑස් තොගය, එහි නැව තෙක් නොමිලේ (FOB) වටිනාකම්, සපුගස්කන්ද පිරිපහදුවෙන් ලබාගත් තොගවල ඉතිරි ප්‍රමාණ ආදියේ වටිනාකම් පිළිබඳව මිල වැඩි කිරීමේදී අවධානය යොමු කර නොතිබුණි.

(vii) ඖෂධ

-------

* අධිකාරිය විසින් බටහිර ඖෂධ සඳහා උපරිම සිල්ලර මිල තීරණය කිරීමේ වැඩසටහනක් සකස් කර තිබූ අතර, මෙය වෙනම ඒකකයක් ලෙස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඒ සඳහා රු.3,616,000 ක පිරිවැය ඇස්තමේන්තුවක්ද සකස් කර තිබුණි. කෙසේ වුවද, මෙම වැඩසටහන සැලසුම් කළ පරිදි සැලකිය යුතු ප්‍රගතියක් ඇතිකර ගෙන නොතිබුණි.

* අධිකාරිය විසින් 2011 වර්ෂයේදී ඖෂධ වෙළඳාම පිළිබඳ මූලික විමර්ශනයක් සිදුකර තිබූ අතර, එම වාර්තාවට අනුව, බටහිර ඖෂධ වර්ග කීහිපයක මිල, රක්ෂණය සහ ගැල් කුලිය (CIF) අගයට වඩා සිල්ලර මිලෙහි සියයට 276 - සියයට 787 දක්වා වූ පරාසයක වැඩිවීමක් ඇති බව වාර්තා කර තිබුණි. එම විමර්ශන වාර්තාව අනුව, පාරිභෝගික කටයුතු සභාව විසින් බටහිර ඖෂධ වර්ග සම්බන්ධව ප්‍රධාන නිර්දේශ 10 ක් ඉදිරිපත් කර ඉන් 06 ක් අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ යුතු බව දක්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

  - පාරිභෝගික කටයුතු සභාව විසින් බටහිර ඖෂධ මිල, රක්ෂණය සහ ගැල් කුලිය (CIF) අගයෙන් සියයට 80 - සියයට 85 ත් අතර පරාසයක තැබිය යුතු බවට නිර්දේශ කර තිබුණද, ඒ පිළිබඳව ක්‍රියා කර නොතිබුණි.

  - 2002 ඔක්තෝබර් 22 දින එවකට පැවති ඖෂධ මිල පාලන ගැසට් නිවේදනය අවලංගු කිරීමටත්, 2003 පාරිභෝගික කටයුතු අධිකාරිය පිහිටුවීමෙන් පසුව නැවත, මිල පාලනය සම්බන්ධ ගැසට් නිවේදන නිකුත් කිරීමටත් කටයුතු නොකිරීම නිසා ඖෂධවල විශාල ලෙස මිල වැඩිවීමට හේතු වී තිබුණි. මින් ප්‍රයෝජන ගත් ඖෂධ ආනයනකරුවන් හා නිෂ්පාදකයන් තම අභිමතය පරිදි අධික මිල ගණන් පනවමින් පාරිභෝගිකයා සූරාකෑමට ලක්කර තිබුණද, අධිකාරිය ඒ සම්බන්ධයෙන් විධිමත් වූ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

  - පාරිභෝගික කටයුතු සභාව විසින් ඉදිරිපත් කළ නිර්දේශ 10 න් අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ යුතු බව දන්වා තිබූ නිර්දේශ 06 න් සියළුම ඖෂධවල මැකිය නොහැකි තීන්ත වර්ගයකින් ඇසුරුම් හෝ බහාලුම්වල මතුපිට හා ඇතුළත විකිණිය යුතු උපරිම මිල සලකුණු කිරීම යන නිර්දේශය පමණක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණි. නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේදී සෞඛ්‍ය හා මුදල් අමාත්‍යාංශවල සහාය ලබා ගත යුතු බව සභාපතිවරයා දැනුම් දී ඇත.

(ඇ) ශ්‍රී ලංකාවේ පානීය ජල බෝතල් නිෂ්පාදනයට, නිෂ්පාදකයන් විශාල ප්‍රමාණයක් නැඹුරු වී තිබු අතර පාරිභෝගික ජනතාවගෙන්ද ඒ සඳහා විශාල ඉල්ලුමක් වර්තමානයේදී තිබුණි. දිනකට ජල බොතල් ලක්ෂ 50 ක් පමණ වෙළඳපලේ අලෙවි වන භාණ්ඩයක ගුණත්වය සම්බන්ධයෙන් ප්‍රමිති සහතිකයන් තිබිය යුතු වුවත්, එවැන්නක් අනිවාර්ය කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ප්‍රමිති සහතිකය අනිවාර්ය නොවීම හේතුවෙන් ඉවතලන බෝතල් පවා එකතු කර පිරිසිදු නොකරන ලද ජලය ඇසුරුම් කරන තත්ත්වයක් ඇති වී තිබුණි.

(ii) 2012 වර්ෂය තුළ අධිකාරිය විසින් සිදු කරන ලද විමර්ශනයට අනුව, ජල බෝතල් අනිවාර්ය තත්ත්ව පරීක්ෂාවකට යටත් විය යුතු බවත්, පාරිභෝගිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා අධිකාරියේ පාලනයට යටත් විය යුතු බවත් ප්‍රමිති කාර්යාංශයේ ප්‍රමිති සහතිකය ලබා ගැනීම අනිවාර්ය කළ යුතු බවත් නිර්දේශ කර තිබුණි.

(iii) කෙසේ වුවද, පාරිභෝගික අධිකාරිය පනතින් පැවරී ඇති බලතල අවම වශයෙන් හෝ යොදමින් ගැසට් නිවේදනයක් මගින් ප්‍රමිතියෙන් තොරව පවතින මෙම කර්මාන්තය පාලනය කිරීමට ක්‍රියාකර නොතිබුණි.

(ඈ) යහපත් හා නීත්‍යානුකූල වෙළඳ ව්‍යාපාර ඇති කිරීම මූලික අරමුණ කර ගෙන "ආදර්ශ වෙළඳසැල්" සංකල්පය හඳුන්වා දී තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි එවැනි වෙළඳසැල් 324 ක් හඳුනාගැනීමට ඉලක්ක කර තිබුණද, 2012 දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රිකයේ පමණක් මෙම සංකල්පය ක්‍රියාත්මක කර වෙළඳසැල් 66 ක් පමණක් හඳුනාගෙන තිබුණි.

(ඉ) වෙළඳපොල තුළ යහපත් තරඟයක් ඇතිකිරීම සඳහා දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වැඩමුළු 280 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, පවත්වන ලද වැඩමුළුවලින් සියයට 80 ක් කොළඹ, ත්‍රිකුණාමලය හා මාතර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පමණක් පවත්වා තිබුණි.

(ඊ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 39 වගන්තිය අනුව, පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවක් පිහිටුවා තිබුණද, ඒ සඳහා පනතේ 39 (2) වගන්තිය ප්‍රකාර සුදුසුකම්ලත් සාමාජිකයින් පත් කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

4.2 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජන වත්කම්

---

2012 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් පාවිච්චියට ගත නොහැකි ලෙස හඳුනාගෙන තිබූ අයිතම් 82 ක් තක්සේරු කර අපහරණය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට 2013 සැප්තැම්බර් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

4.3 වෙනත් රජයේ ආයතනවලට ලබා දුන් අධිකාරියේ සම්පත්

---

අමාත්‍යාංශයට අයත් ජීප් රථයක් 2011 වර්ෂයේදී අලුත්වැඩියා හා සේවාකිරීම් වෙනුවෙන් රු.3,361,475 ක් අධිකාරියේ අරමුදලින් වැය කර තිබූ අතර මෙම සම්පූර්ණ වියදම ප්‍රතිපූර්ණය කිරීම අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

4.4 අධිකාර බලය නොලත් ගනුදෙනු

---

අභ්‍යන්තර වෛද්‍ය දෙපාර්තමේන්තුව සහ සාධාරණ වෛද්‍ය කොමිසම ක්‍රියාත්මකව පැවති කාලයේ පිහිටුවන ලද අරමුදලක තිබූ රු.21,837,975 ක ශේෂයක් පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත පැවරීම 2005 ජනවාරි 18 දින රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර තිබුණි.

මෙම මුදල් භාණ්ඩාගාරය විසින් අමාත්‍යාංශය හරහා පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත නිදහස් කිරීමේදී "පාර්භෝගික සේවා අරමුදල පිහිටුවීමේදී පාදක කරගන්නා ලද අරමුණු සඳහා මෙම මුදල් යොදා ගැනීම සම්බන්ධව විරුද්ධත්වයක් නොමැත" යනුවෙන් දක්වා තිබුණි. කෙසේ වුවත්, ඉන් රු.14,000,000 ක මුදලක් අරමුදල පිහිටුවීමේ අරමුණ වන පාර්භෝගික අධ්‍යාපනය හා ප්‍රවර්ධනය වෙනුවෙන් වැය නොකර වෛද්‍යපල විමර්ශණ කටයුතු සඳහා යොදවාගත් පෞද්ගලික වාහන සැපයුම්කරුවන්ට කුලී ගෙවීම සඳහා භාවිතා කර තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ කාර්ය මණ්ඩල තත්ත්වය පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමණාකරු | 08 | 07 | 01 |
| කළමණාකරු | 25 | 07 | 18 |
| කනිෂ්ඨ කළමණාකරු | 40 | 07 | 33 |
| විධායක නොවන | 265 | 193 | 72 |
| ප්‍රාථමික | 32 | 23 | 09 |
| | 370 | 237 | 133 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත දැක්වෙන තනතුරු 133 ක පුරප්පාඩු පිරවීමට අධිකාරිය ක්‍රියා කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් තනතුරු 11 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගෙන තිබුණු අතර ඉන් ජ්‍යෙෂ්ඨ මාධ්‍ය නිලධාරි, රියදුරු හා කාර්යාල සහායකයින් දෙදෙනෙකු රේබීය අමාත්‍යාංශයේ රාජකාරි සඳහා මුදා හැර තිබුණි. නමුත් එම නිලධාරීන්ගේ මාසික වැටුප් ලෙස රු.684,660 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක නොකිරීම

2011 නොවැම්බර් 14 හා 15 දෙදින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය පිහිටීමත් කළ යුතු බවට හා වැඩ බැලීමේ පදනම මත පත්කර තිබූ නිලධාරීන් 08 දෙනාගේ තනතුරු මාස 03 ක් ඇතුළත පිරවිය යුතු බවට නියෝග කර තිබුණද, 2012 දෙසැම්බර් 31 දින වන විටත් අභ්‍යන්තර විගණන ඒකකය පිහිටීමත්ව ස්ථාපිත කිරීමටත් වැඩබැලීමේ පුරප්පාඩු පිරවීමටත් කටයුතු කර නොතිබුණි.

5.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වා තිබූ අතර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් 03 දෙනෙකු කිසිදු රැස්වීමකට සහභාගි වී නොතිබුණි.

(ආ) අනෙකුත් සාමාජිකයන්ගේ රැස්වීම් වලට සහභාගීවීමද දුර්වල මට්ටමක පැවතුණු අතර, ඉන් එක් සාමාජිකයෙකු පත්වීම් දින සිට කිසිදු රැස්වීමකට සහභාගී වී නොතිබුණි. සාමාජිකයින් 04 දෙනෙකුගේ සහභාගීත්වය සියයට 04 සිට සියයට 25 දක්වා වූ පරාසයක විය.

6. පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් පාලනය

(ඇ) මානව සම්පත් කළමනාකරණය

(ඈ) නිශ්චිත භාණ්ඩ හඳුනා ගැනීම හා එහි මිල පාලන ක්‍රියාවලිය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

වැඩබලන විගණකාධිපති

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය හා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා සභාපතිවයාගේ අදහස් දැක්වීම**

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ප්‍රත්‍යාගණනය සම්බන්ධයෙන් අධිකාරියේ ගිණුම්කරන ප්‍රතිපත්තිය වනුයේ වත්කම කාණ්ඩයන් වශයෙන් ගෙන කාලීනව ප්‍රත්‍යාගණනය කිරීමයි. ඒ අනුව පොත් අගය සහ වෙළෙඳපොල අගයන්හි විශාල වශයෙන් විචලනයන් පෙන්වන මෝටර් වාහන පමණක් ප්‍රත්‍යාගණනය කරනු ලබන අතර, ඉදිරියේදී මෝටර් වාහනවලට අමතරව අධිකාරිය සතු අනෙකුත් වත්කම්ද ප්‍රත්‍යාගණනය කර අවසන් ගිණුම් සැකසීමට අවශ්‍ය කටයුතු කරනු ඇත.

(ආ) මෙය 2013 වර්ෂයේ 'දී නිවැරදිව සටහන් කරන ලදී.

2.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට අනුකූල නොවීම

(අ) 2013 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.5 (අ) ඡේදය හා 1999.10.01 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 හි 1.3 වගන්තිය හා ඊට ලබා දුන් සංශෝධන චක්‍රලේඛය අනුව 13/2008 හි 7 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල නියෝජ්‍ය අධ්‍යක්ෂ මට්ටමේ විධායක නිලධාරීන් සඳහා කි.මී. 50 නොඉක්මවන දුර ප්‍රමාණයකට ඔවුන්ගේ නිවෙස්වල සිට කාර්යාලයට පැමිණීමටත් නැවත නිවෙස් කරා යෑමටත් සමූහ ප්‍රවාහන පහසුකම් සැපයීමට හැකිය. ඒ අනුව අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් අදාල සමූහ ප්‍රවාහන ක්‍රමයක් ඉල්ලුම් කළත් පවතින සංචිත වාහන ප්‍රමාණය අනුව නිලධාරීන් පදිංචි විවිධ ප්‍රදේශයන් කරා සමූහ වාහන යෙදවීම අධික වියදමක් සහිත ප්‍රායෝගික නොවන කාර්යයක් විය. ඒ අනුව මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවීම සමූහ ප්‍රවාහන පහසුකම් සැපයීමට වඩා අධිකාරියට ලාභදායි බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාල ප්‍රවාහන දීමනාව ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක CAA/HRA/60/2012/AOB-06-06 සහ CAA/HRA/60/2012/AOB-09-02 මගින් අදාල අනුමැතිය ලබා දී ඇත. මේ සඳහා තවදුරටත් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන බවට වැඩිදුරටත් සඳහන් කරමි.

(ආ) 2010 දෙසැම්බර් 07 දිනැති අංක බීඩී/ජීබීඑස්/130/9/12 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය

එසේ කුලී පදනම මත වාහන ලබා ගෙන ඇත්තේ 2003 අංක 9 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ විධානයන්ට අනුව පත් කරන ලද අධිකාරියේ සභාපති හා පූර්ණ කාලීන සාමාජිකයින් තිදෙනා වෙත අනුයුක්ත කිරීමට බව සඳහන් කරමි. අධිකාරිය සතු වාහන සංචිතයේ එම නිලධාරීනට අනුයුක්ත කිරීමට වාහන නොවූ බැවින් එසේ කුලියට ලබා ගත් වාහන ලබා දෙන ලදී. එම නිලධාරීන් හට අනුයුක්ත කිරීම සඳහා සුදුසු වාහන අධිකාරිය වෙත ලබා ගැනීමට මේ විට ඉල්ලුම්කර ඇති අතර එම වාහන ලද විගස මෙම කුලී වාහන ඉවත් කරන බව සඳහන් කරමි.

3.1 මූල්‍ය ප්‍රතිඵල

ආයතනයේ කාර්යයන් පුළුල් කිරීම සඳහා නව සේවකයන් බඳවාගැනීමත් හා ඊට අනුරූපීව මෙහෙයුම වියදමද වැඩිවීම නිසා ඊට පෙර වර්ෂයට අනුරූපීව මූල්‍ය ප්‍රතිඵලය රු. 7,055,252.00 කින් අඩු වී ඇත.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

අ. වෙළෙඳපොල වැටලීම් හා විමර්ශනයන්

වෙළෙඳපොළ වැටලීම් හා විමර්ශනයන් සඳහා ඉලක්ක සකස් කිරීමේදී 2013 2වන කාර්තුවේ සිට නව විමර්ශන නිලධාරීන් දිස්ත්‍රික් කාර්යාලවලට බඳවා ගන්නා බවට උපකල්පනය කරන ලදී. ඒ අනුව එක් එක් දිස්ත්‍රික්කය සඳහා පහත සඳහන් පරිදි නිලධාරීන් දෙවන කාර්තුවේ මුල සිට වැටලීම් සඳහා අළුතින් යොදා ගැනීමට හැකිවෙතැයි උපකල්පනය කොට ඇත.

| දිස්ත්‍රික්කය | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 03 |
| ගම්පහ | 01 |
| කළුතර | 04 |
| ගාල්ල | 04 |
| මාතර | 03 |
| හම්බන්තොට | 03 |
| මහනුවර | 02 |
| නුවරඑළිය | 02 |
| යාපනය | 04 |
| වවුනියාව | 02 |
| මන්නාරම | 03 |
| කිලිනොච්චිය | 03 |
| මුලතිව් | 03 |
| ත්‍රිකුණාමලය | 02 |

| දිස්ත්‍රික්කය | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| අම්පාර | 03 |
| මඩකලපුව | 03 |
| කුරුණෑගල | 01 |
| පුත්තලම | 03 |
| බදුල්ල | 04 |
| මොණරාගල | 02 |
| අනුරාධපුරය | 01 |
| පොළොන්නරුව | 01 |
| රත්නපුර | 04 |
| කෑගල්ල | 02 |

එහෙත් නව විමර්ශන නිලධාරීන් බඳවා ගැනීම සිදු කරන ලද්දේ 2012 දෙසැම්බර් මස වන අතර, එබැවින් 2012 වසර සඳහා නව විමර්ශන නිලධාරීන් විමර්ශන කටයුතුවලට යොදා ගැනීමට නොහැකි විය. එය ඇස්තමේන්තු කරන ලද වැටලීම් හා දඩ මුදල් ප්‍රමාණය අඩු වීමට හේතු වූ කරුණකි.

එමෙන්ම අදාල ඉලක්ක බලාපොරොත්තු වූ ප්‍රමාණයට ළඟා කර ගැනීමට නොහැකි වීමට පහත සඳහන් කරුණුද හේතු වී ඇත.

- 2010 වසරේදී සිට අධිකාරිය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද ඉලක්ක ගත වෙළෙඳපොළ විමර්ශන හා වැටලීම් ක්‍රියාවලිය තුළින් බොහෝ වෙළෙඳුන් මේ වන විට පාරිභෝගික නීතිරීති පිළිබඳව දැනුවත් වී තිබීම.

- අධිකාරිය විසින් වෙළෙඳ ප්‍රජාව සඳහා ක්‍රියාත්මක කල දැනුවත් කිරීමේ වැඩ සටහන් තුළින් ද වෙළෙඳ ප්‍රජාව පාරිභෝගික නීතිරීති පිළිබඳව දැනුවත් වී ඇත (පාරිභෝගික සමිති බලගැන්වීම තුළින්).

- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි වැටලීම් කෝණය වෙනස් කිරීම එනම් විශේෂ වැටලීම් කිරීම, මෙවැනි විශේෂ වැටලීම් මගින් මහා පරිමාන ව්‍යාපාර වල නීතියට පටහැනි වෙළෙඳාම, විශාල පරිමානයේ තොග රැස්කර ඇති ස්ථාන වල සිදුකරන, කල් ඉකුත් වූ දින වෙනස්කර වෙළෙඳපලට එවීම, තොග සැඟවීම තුලින් සැපයුම අඩු කිරීම වැනි දේ සිදු කර ව්‍යාපාරිකයින්ට විරුද්ධව නීතිමය කටයුතු කිරීමේදී වැඩිපුර මිනිස් පැය ගණනක් සහ ශ්‍රමය යෙදවීමට එම නිලධාරීන්ට සිදු වේ. උදා: එළවළු ප්‍රවාහනය සඳහා නිර්දේශිත ඇසුරුම් භාවිතය, සහල්, අල, ළූණු, සුදු ළූණු, හාල්මැස්සන් වැනි ආහාර තොග පරිභෝජනය සඳහා සුදුසුදැයි පරීක්ෂා කිරීම, රතු සහල්, කුළු බඩු සඳහා ඩයි වර්ග මිශ්‍ර කිරීම පරීක්ෂාව, පොල්තෙල්වලට පාම් තෙල් මිශ්‍රකර අලෙවි කිරීම පරීක්ෂාව (මේවා පරීක්ෂා

කරන ආයතන වලට යවා පරීක්ෂා කරවා ගෙන නීතිමය කටයුතු කිරීමට සිදුවේ), සිමෙන්ති හා ගොඩනැගිලි කර්මාන්තය සඳහා යොදා ගන්නා යකඩ පිළිබඳව සිදු කරන වැටලීම්, පානීය ජල බෝතල්වල ගුණාත්වය පරීක්ෂා කිරීම, තේකොළ වලට බාහිර ද්‍රව්‍ය මිශ්‍රකර ඇත්දැයි පරීක්ෂා කිරීම, භාවිතයට නුසුදුසු සැමන් ඉවත් කිරීම වැනි වැටලීම් සඳහා වැඩි කාලයක් මෙන්ම ශ්‍රමයක් යොදා ගැනීමට සිදුවේ. මෙහිදී වැටලීම් ප්‍රමාණය සංඛ්‍යාත්මකව අඩු වුවද, වෙළෙඳපොළ ගැටළු හඳුනාගෙන අදාල භාණ්ඩ තොග වෙළෙඳසැලෙනස් ඉවත් කිරීමට කටයුතු සිදු කරනු ලබන බැවින් පාරිභෝගික සුරක්ෂිතතාව තහවුරු වීම සිදුවේ.

(ආ) (i) කුකුල් මස්

සම සහිත කුකුල් මස් සඳහා උපරිම සිල්ලර මිළ සඳහන් ගැසට් පත්‍රයක් (අංක 1641/48 දරණ 2010 පෙබරවාරි 18 දින) මගින් මිළ නියම කරන ලද අතර, සම රහිත හා කොටස් වශයෙන් නිකුත් කරනු ලබන අනෙකුත් කුකුල් මස් සඳහාද මිළ පාලනයක් නොකරන ලදී. සම ඉවත් කළ හා කුකුල් මස් කොටස් සඳහා උපරිම සිල්ලර මිළක් නියම කිරීම සඳහා ඉවත් කරන සමෙහි සාමාන්‍ය බර ප්‍රමාණය පිළිබඳ පශු සම්පත් අමාත්‍යාංශයේ නිර්දේශිත ගණනයන් විමසා ඇති අතර, එම තොරතුරු ලැබුණු වහාම ඒ පිළිබඳ පියවර ගැනීමට නියමිතය. (භාණ්ඩාගාරයේද උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරනු ඇත).

කුකුල් මස් සඳහා වූ මිළ පාලනය ඉවත් කර තිබූ කාලයේ මිළ ඉහළ යාම පිළිබඳ කරුණු විමර්ශනය කර වාර්තා කිරීම සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් වාර්තා කර නොමැති බව ඔබගේ විගණන වාර්තාවේ සඳහන් කර තිබුණද එම කාර්යය අධිකාරියේ සභාපතිතුමා විසින් වාර්තා කර තිබුණි.

(II) කිරිපිටි

සම්පූර්ණ යොදය සහිත කිරිපිටි

2013.01.28 දිනැති EC/E/CAA/2013 AQ-02 යොමු අංක දරණ විගණන විමසුමට 2013.04.12 දින අධිකාරිය විසින් පිළිතුරු යවන ලදී. නමුත් කිරිපිටි සම්බන්ධව තවදුරටත් යොමු කරන ලද විගණන විමසුමට අදාල තොරතුරු පහත පරිදි වේ.

| සමාගම | කිරි වර්ගය | ප්‍රමාණය | සමාගම ඉල්ලුම් කළ මිළ (1) | අයදුම් කළ මිළෙහි අඩංගු ආනයන බදු | අධිකාරිය ලබා දුන් මිළ (2) | එහි ඇතුලත් බදු ප්‍රමාණය (3) | අධිකාරිය ලබා දුන් මිළ (බදු රහිත) (4)=(2)-(3) | අධිකාරිය ලබා දුන් මිළ හා ඉල්ලුම් කළ මිළ අතර වෙනස (5=[4-1]) |
|---|---|---|---|---|---|---|---|---|
| පොන්ටෙරා | ඇන්කර් | ග්‍රෑ 400<br>කි 1 | 316.00<br>763.00 | නැත<br>නැත | 325.00<br>810.00 | 36.80<br>92 | 288.20<br>718.00 | - 27.80<br>- 45.00 |
| නෙස්ලේ | නෙස්ප්‍රේ | ග්‍රෑ 400<br>කි 1 | 308.00<br>749.00 | නැත<br>නැත | 325.00<br>800.00 | 36.80<br>92 | 288.20<br>708.00 | -19.80<br>-41.00 |
| මැලිබන් | මැලිබන් | ග්‍රෑ 400<br>කි 1 | 298.73<br>738.33 | නැත<br>නැත | 325.00<br>810.00 | 36.80<br>92 | 288.20<br>718.00 | -<br>- 20.00 |
| ලංකා මිල්ක් ෆුඩ්ස් | ලක්ස්ප්‍රේ | ග්‍රෑ 400<br>කි 1 | 285.00<br>700.00ෆ | නැත<br>නැත | 325.00<br>810.00 | 36.80<br>92 | 288.20<br>718.00 | 3.20<br>18.00 * |

යොදය රහිත කිරිපිටි

යොදය රහිත කිරිපිටි මිළ පාලනයක් නොකළ අතර, ඒ සඳහා අවශ්‍ය කරන ඉදිරි ක්‍රියා මාර්ග ගනිමින් පවතී.

(iii) ළදරු කිරි ආහාර

2003.08.20 සිට 2012.08.18 දින දක්වාවර්ෂ 9කට ආසන්න කාලයක් ළදරු කිරිපිටි මිළ පාලනය සඳහා මැදිහත් නොවූ බව පිළිගත නොහැකි අතර, 2003.08.20 දින නිකුත් කරන ලද 1302/24 අංක දරණ ගැසට් පත්‍රය පළකිරීමෙන් පසු ජේ එල් මොරිසන් සහ පුත්‍ර සමාගමට හා 2007 වර්ෂයේදී නෙස්ලේ සමාගමට ද එම සමාගම් හි ළදරු කිරිපිටි වර්ගයන් වෙනුවෙන් අධිකාරිය මිළ තීරණ ලබා දී ඇත. (ඔබ විසින් මීට ඉහත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් අංක 3 සඳහා ලබාදී ඇත්තේ මෙම පිළිතුරය.

2012 ජුනි 18 දිනැති අංක 1763/4 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සමාගම් 6ට අයත් ළදරු කිරිපිටි වර්ග සඳහා පාලන මිළ නියම කරන ලදී. නමුත් එම සමාගම් 6න් එක් සමාගමක් පමණක් එහි එක් වර්ගයකට පැනවූ මිළ සාධාරණ නොවන බව පවසා නඩු පවරන ලදී.

අධිකාරිය විසින් පාලන මිළ ගණනය කිරීමේදී වෙළෙඳපොල මිළ හා එක් එක් සමාගමේ පිරිවැය ඇස්තමේන්තු විශ්ලේෂණය කර එම පිරිවැය ව්‍යුහයන් අධ්‍යයනය මගින් ලබා ගත් ප්‍රතිශත අනුව ගොඩනැගූ සූත්‍රය භාවිතා කිරීම උපකල්පන පමණක් භාවිතා කර තිබුණා ලෙස අර්ථ දැක්වීම නිවැරදි නොවේ.

2012.08.18 දිනැති අංක 1763/4 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ළදරු කිරි ආහාර සඳහා මිළ පාලනයක් කල අතර, නීති උපදෙස් මත 2013 ජූලි 10 වන දින අංක 1818/11 දරණ ගැසට් පත්‍රය මගින් ඉහත සඳහන් ගැසට් පත්‍රය පරිච්ඡින්න කරන ලදී.

IV සිමෙන්ති මිළ

ඉදි කිරීම් සමාගම් වලට නිකුත් කරන සිමෙන්ති (bulk) සඳහා පැවතිය යුතු මිළ සහ සාමාන්‍ය ජනතාව විසින් ඉදිකිරීම් සඳහා යොදා ගනු ලබන සාමාන්‍ය ජන ජීවිතයට බලපාන සිමෙන්ති ඇසුරුම් වර්ගය ලෙස හඳුනාගත හැක්කේ කිලෝ ග්‍රෑම් 50 සිමෙන්ති ඇසුරුම් වලට අදාල මිළ සැලකීමේදී, අවසාන සිල්ලර මිළක් නියම කිරීමට සහ වෙළෙඳපොල තුල එම පාලන මිළ ක්‍රියාත්මක වන්නේද යන්න පරීක්ෂා කිරීමේ හැකියාව පවත්නේද කි. ග්‍රෑ 50 ඇසුරුම් සඳහය.

Bulk වශයෙන් මිළදී ගන්නේ මහා පරිමාන ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා වන අතර, එය වෙළෙඳපොලේ මිළ කෙරෙහි කෙසේ බලපාන්නේද යන්න පාරිභෝගික සභාව මගින් සමීක්ෂණයක් කිරීමට සහ ඒ අනුව මිළක් නියම කිරීම සුදුසු වේ නම් ඒ සඳහා කටයුතු කිරීමටත් අධිකාරිය යොමු වනු ඇත.

V තිරිඟු පිටි

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි අවසරයකින් තොරව මිළ වැඩි කරන අවස්ථාවන්හිදී ඊට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත.

VI ලික්විඩයිට් පෙට්‍රෝලියම් (එල්පී) ගෑස්

ගෑස් මිළ අඩු කළ අවස්ථාවක පැරණි ගෑස් මිළට විකිණීමක් සිදුවන විට, ඒ සඳහා පැමිණිළි ලැබුණු පසු වෙළෙඳපොල වැටලීම් කර නඩු පැවරීම සිදු කරනු ලබයි. ලෝක වෙළෙඳපොළෙහි මිළ අඩුවන්නේ නම්, ගෑස් මිළ සූත්‍රය අනුව යෙදීමෙන් විකුණුම් මිළ ගණනයේදී අවසන් සිල්ලර මිළද අඩුවෙයි. එබැවින් 19(2) වගන්තිය යටතේ පාරිභෝගික සභාව වෙත යොමු කිරීමේ අවශ්‍යතාවයක් නැත.

දැනට ගෑස් සඳහා මිළ ගණනය කරන්නේ

- ලාෆ් සමාගම සඳහා අධිකරණය විසින් නියම කරන ලද මිළ සූත්‍රය
- ලිට්‍රෝ සමාගම සඳහා ෂෙල් සමාගම සමඟ එකඟ වූ මිළ සූත්‍රය අනුවය. තොග ගැලපීම රහිතව මෙම සූත්‍ර දෙකම සාදා ඇත්තේ, පෙර මාස 2ක කාලයක් සඳහා විකුණන ලද ගෑස් ප්‍රමාණය සඳහා භාවිතා කරන ලද සපුගස්කන්ද පිරිපහදුවෙන් ලබා ගන්නා ගෑස් ප්‍රමාණය පළමුව භාවිතා කර ඉතිරි විකුණුම් ප්‍රමානය සඳහා අවශ්‍ය වන ආනයනය කරන ලද ගෑස් ප්‍රමාණයෙහි වියදම එකතු කිරීමයි.

ඒ අනුව සපුගස්කන්ද තෙල් පිරිපහදුවෙන් ලබා ගන්නා ගෑස් වල තොගයක් ඉතිරි නොවේ.

එම මිළ සූත්‍රය සකසා ඇති ආකාරය අනුවඉතිරි තොග ගැලපීමක් අවශ්‍ය නොවේ.

VII ඖෂධ

උපරිම මිළ තීරණය කිරීමේ වැඩ සටහන් සකස් කර වෙනම ඒකකයක් ලෙස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඒ වෙනුවෙන් පිරිවැය ඇස්තමේන්තු සකස් කළද, ඒ සඳහා කළමණාකරන දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය අනුමැතිය ලැබී නැත.

කෙසේ වුවද, මෙම ඖෂධ මිළ පාලනය වැඩ සටහනෙහි ප්‍රගතියෙක් අත් කරගෙන නොමැති බව පැවසීම සාවද්‍ය වේ. දැනට මෙම වැඩ සටහන යටතේ උපරිම සිල්ලර මිළක් ලකුණු කිරීමට ආනයන කරුවන් හා නිෂ්පාදකයින් වෙත වගකීම පවරමින් ගැසට් පත්‍ර නිකුත් කර ඇත.

පාරිභෝගික සභාවෙහි නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රායෝගික පිළිවෙත් සැදීම කර ගෙන යන අතර, ඖෂධ මිළ පාලනය ජාතික ඖෂධ ප්‍රතිපත්තිය සමග බැඳුනු කාරණාවක් වන බැවින් සෞඛ්‍යය අමාත්‍යාංශය සමග සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලද අතර, එහි පළමු පියවර ලෙස මිළ සලකුණු කිරීම හා එම මිළ ලැයිස්තු පාරිභෝගික අධිකාරිය වෙත ලබා ගනිමින් වර්තමානයේ ලිය පදිංචි වී ඇති නමුත් වෙළෙඳපොලෙහි නොපවතින ඖෂධ වර්ග හඳුනා ගැනීම සිදු කරමින් පවතී.

තවද, පාරිභෝගික සභාවෙහි 10 වෙනි නිර්දේශයෙහි දක්වා ඇති පරිදි නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේදී සෞඛ්‍ය අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශයෙහි සහය ලබා ගත යුතුය.

ඇ (i) (ii) (iii) = ජල බෝතල් සඳහා ප්‍රමිති කාර්යාංශයේ ප්‍රමිති සහතික නිකුත් කිරීමේදී අදාල වන පරීක්ෂාවන් සඳහා ඔවුන්ගේ හැකියාව (අදාල පරීක්ෂාවන් නිරතුරුව කිරීම සඳහා කාර්ය මණ්ඩලය හා රසායනාගාර ඉඩ පහසුකම් පිළිබඳ) ප්‍රමිති ආයතනය විසින් තහවුරු කළ යුතුය. දැනට මෙය පිළිබඳ තොරතුරු විමසා ඇත.

ඈ. ආදර්ශ වෙළෙඳසැල් සංකල්පය හඳුන්වා දීම

ආදර්ශ වෙළෙඳසැල් තේරීම සිදු කරනු ලබන්නේ ඒ සඳහා සකස් කරන ලද නිර්ණායක සමූහයකින් යුත් ඇගයීම් ක්‍රියාවලියක් තුළිනි. මේ සඳහා අප නිලධාරීන් අදාළ වෙළෙඳසැල් වෙත ගොස් අදාළ නිර්ණායක ඔස්සේ වෙළෙඳසැල් පරීක්ෂා කිරීම සිදු වේ. මෙය විශාල වශයෙන් මිනිස් පැය ගණනක් වැය

කිරීමට සිදුවන කාර්යයකි. කෙසේ වෙතත් අධිකාරිය විසින් මෙම වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පවත්වන ලද දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සමාගාමීව එම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22ක වෙළෙඳසැල් 2,641ක් පරීක්ෂා කර, ආදර්ශ වෙළෙඳසැල් 66ක් හඳුනාගැනීමට කටයුතු සිදුකර ඇත. ඉදිරියේදී ද දැයට කිරුළ වැඩ සටහන පවත්වනු ලබන දිස්ත්‍රික්ක තුළ මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමට අධිකාරිය පියවර ගනු ඇත.

ඉ. වෙළෙඳුන් සඳහා වැඩමුළු පැවැත්වීම

(i) 2012 වසරේදී වෙළෙඳුන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් 177ක් ක්‍රියාත්මක කිරීමට අධිකාරිය කටයුතු කර ඇත. මෙම වැඩමුළු කොළඹ, මාතර, නුවර, ත්‍රිකුණාමළය, නුවරඑළිය, පුත්තලම, වවුනියාව, යාපනය, රත්නපුර, මාතලේ, මඩකළපුව, හම්බන්තොට, අනුරාධපුරය, පොළොන්නරුව, බදුල්ල, කුරුණෑගල, කෑගල්ල යන දිස්ත්‍රික්කවල පවත්වන ලදී.

(ii) ගම්පහ, කළුතර, ගාල්ල, මොණරාගල දිස්ත්‍රික්කවල නිලධාරීන්ට ඉදිරියේදී එම වැඩමුළු පැවැත්වීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත.

(iii) යාපනය හා වවුනියාව දිස්ත්‍රික්කවල දිසාපතිවරුන් විසින් සිදුකරනු ලැබූ ඉල්ලීම් මත යාපනය හා වවුනියාව දිස්ත්‍රික්ක වලද වෙළෙඳුන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු 4ක් පැවැත්වීමට අධිකාරිය කටයුතු කොට ඇත.

මේ අනුව 2012 වසරේදී දිස්ත්‍රික්ක නියෝජනය කරමින් පාරිභෝගික සංවිධාන 60ක් පිහිටුවීමට අධිකාරිය කටයුතු කර ඇත. එක් දිස්ත්‍රික්කයක සිටින නිලධාරීන් ප්‍රමාණය සීමාසහිත වීම එම නිලධාරීන් විසින් දිස්ත්‍රික්කය තුළ සිදු කළ යුතු සියළු කාර්යයන් ඉටු කළ යුතු වීම (වෙළෙඳපොළ විමර්ශන හා වැටලීම්, පාරිභෝගික පැමිණිලි සඳහා විසඳුම්, පාරිභෝගික/ වෙළෙඳුන් දැනුවත් කිරීම්, පාරිභෝගික සංවිධාන පිහිටුවීම, වෙළෙඳපොළ සමීක්ෂණ සිදුකිරීම, දිස්ත්‍රික්කවල දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාම) මීට අමතරව වාහන පහසුකම් හා ඉන්ධන සීමාසහිත වීම වැනි කරුණුද ඔබ විසින් සඳහන් කරන ලද දිස්ත්‍රික්කවල පාරිභෝගික සංවිධාන පිහිටුවීම අතපසු වීමට බලපා ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී එම දිස්ත්‍රික්කවල ද පාරිභෝගික සංවිධාන පිහිටුවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

(ii) පාරිභෝගික සමාජ පිහිටුවීම

පාසැල් පාරිභෝගික කව පිහිටුවීම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් අළුතින් අරඹන ලද කාර්යයකි. 2012 වසරේදී ප්‍රධාන වශයෙන්ම බලාපොරොත්තු වූයේ කොළඹ දිස්ත්‍රික්කය තුළ පාසැල් පාරිභෝගික කව 4ක් පිහිටුවීමට වන අතර, 2012 වසර තුළදී කොළඹ දිස්ත්‍රික්කයේ පාසැල් 13ක පාසැල් පාරිභෝගික කව පිහිටුවීමට අධිකාරියට හැකි වී ඇත. මෙයට අමතරව මෙම වසර තුළදීම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ද පාසැල් පාරිභෝගික කව 27ක් පිහිටුවීමට අධිකාරයට හැකි වී ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී තිබෙන සම්පත් ප්‍රමාණය අනුව අනෙකුත් දිස්ත්‍රික්කවල ද පාසැල් පාරිභෝගික කව පිහිටුවීමට ක්‍රියාත්මක වනු ඇත.

උ සභාවේ සාමාජිකයන් පත් කිරීම පනතේ 39(2) වගන්තිය ප්‍රකාරව පැවරී ඇත්තේ විෂය භාර අමාත්‍යතුමා වෙතය

පනතේ 41(3) වගන්තිය ප්‍රකාරව සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක එම ඉල්ලීම ලැබී මාසයක් ඇතුලත ඒ සම්බන්ධයෙන් නියමයක් කළයුතු වව ද යම් යම් අවස්ථාවලදී පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම මත කල් ලබා දීමට සිදු වීම නිසා නියමිත කාලය තුළදී තීරණයක් ලබා දීමට ප්‍රායෝගිව නොහැකි වනු ඇත.

එක් පෞද්ගලික සමාගමකට එරෙහිව තවත් පෞද්ගලික සමාගමක් කරන ලද පැමිණිල්ල (සීඒසී/34/2012)

(i) වගඋත්තරකාර සමාගම තම වෙළෙඳ දැන්වීමෙහි ඇති දෝෂ අවබෝධ කරගෙන විමසීම ආරම්භ කරන අවස්ථාව වන විටත් එය වෙනස් කිරීමට පියවර ගෙන ඇති බව දන්වා සිටියෙන් දෙපාර්ශ්වය සාකච්ඡා කර නිසි පරිදි වෙළෙඳ දැන්වීම සංශෝධනය කිරීම සඳහා දින ලබා දෙන ලදී. .ඉන්පසු මෙය සමථය පිළිබඳ ප්‍රගතිය විමසීම සඳහා කැඳවූ අවස්ථාව වන විට එම භාණ්ඩයේම වෙළෙඳ දැන්වීමක් සම්බන්ධයේ වගඋත්තරකාර සමාගම විසින් මෙහි පැමිණිලිකාර සමාගමට එරෙහිව පවරන ලද පැමිණිල්ක් ද අධිකාරිය විසින් සභාව වෙත යොමු කරනු ලදුව එය සීඒසී/36/2013 ලෙස අංකනය කරන ලදුව එය ද ඉහත පැමිණිල්ලහා එක්ව ගෙන සාකච්ඡා කරන ලදී.

සභාවේ මග පෙන්වීම මත සභාව ඉදිරියේ සුහදව සාකච්ඡා කල පාර්ශ්වරුවන් එකිනෙකාගේ වැරදි අවබෝධ කරනෙ දෙපාර්ශ්වයේ ම දැන්වීම මේ වන විටත් නිවැරදි කර ගැනීමට පියවර ගෙන ඇති බැවින් මෙම පැමිණිලි දෙකම පවත්වා

ගෙන යාම අනවශ්‍ය බව දන්වා 2013.04.27 වන දිනතම තමන්ගේ පැමිණිලි ඉල්ලා අස්කර ගන්නා ලදී. ඒ බවට තවුරු කර සභාව් පවත්වා ගෙන යන ලිපිගොන දෙදෙහි අත්සන් තබන ලදී.

(ii) මාලබේ වෙළෙඳ සංගමය විසින් කරන ලද පැමිණිල්ල (සීඒසී/30/2012)
උක්ත කරුණ සම්බන්ධව විමර්ශන වාර්තාව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තුමා 2012.06.05 වන දින සභා වෙත යොමු කරනු ලදුව සභාව මේ පිළිබඳව අදාල සියළුම පාර්ශ්වයන් කැඳවා දීර්ඝ වශයෙන් දින කිහිපයක්ම සාකච්ඡා කර සියළුම දෙනා හට තම තමන්ගේ අදහස් ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලදී. ඒ අනුව ඉදිරිපත් වූ සියළුම කරුණු සලකා බලා සභාවේ තීරණය 2013.05.17 වන දින ලබා දෙන ලදී.
ඉහත සඳහන් පරිදි එක් එක් විමර්ශනයන් හිදී තීරණයක් දීමට පෙර උද්ගත වන කරුණු සහ අදාල සියළුම පාර්ශ්වයන් හා සමග නිසි පරිදි සාකච්ඡා කිරීම සහ ඔවුන්ගේ අදහස් ලබා ගැනීම කල යුතුව ඇති බැවින් පනතේ නියම කර ඇති කාලවකවානුව තුල විමර්ශනයන් නිම කර තීරණයක් දීමට ප්‍රායෝගිකව නොහැකි බව වැඩිදුරටත් දන්වා සිටිමි.

4.2 නිශ්ක්‍රීය හා ඌන උපයෝජන වත්කම්
මෙම වත්කම් රජයේ ලියා පදිංචි තක්සේරු සමාගමක් මගින් තක්සේරු වාර්තා ලබා ගෙන මෙම නිෂ්ක්‍රීය හා උපයෝජන වත්කම් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී.

4.3 වෙනත් රජයේ ආයතන වලට ලබා දුන් අධිකාරියේ සම්පත්

වියදම ප්‍රතිපූර්නය කිරීම අමාත්‍යාංශය මගින් ප්‍රතික්ෂේප කර තිබුණි යන්න පිළි නොගනී. එනම් CIT/2/ප්‍ර/1/16 හා 2013.03.12 දිනැති ලිපිය මින් මෙම මුදල පවත්නා ප්‍රතිපාදන සීමාවන් තුළ ගෙවීමට එකඟ වී ඇත.

4.4 අධිකාරි බලය නොලත් ගණුදෙනු

පාරිභෝගික අධිකාරිය පිහිටුවනු ලබන්නේ 1979 අංක 1 දරණ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත, 1987 අංක 1 දරණ සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත සහ (173 වන අධිකාරිය) මිළ පාලනය කිරීමේ පනත ඉවත් කිරීම සඳහාද ඒ හා සම්බන්ධ හෝ ඊට අනුශාංගික සියළු කාරණා සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි යනුවෙන් පාරිභෝගික අධිකාරි පනතෙහි ඡේද අංක 1හි සඳහන් කර ඇත.

ඒ අනුව එතෙක් පැවති පනත් අහෝසි වන අතර ක්‍රියාත්මක කළ යුතු වන්නේ 2003 අංක 9 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ ඇති බලතල වේ. පාරිභෝගික අධිකාරි පනතේ අංක 49 (3) හි සඳහන් පරිදි අරමුදලින් ගෙවිය හැකි ද නිර්වචනය කර ඇති අතර 49 (3) ඇ හි මේ පනත යටතේ ස්වකීය බලතල කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමෙහි සහ ඉටු කිරීමෙහි ලා අධිකාරිය සහ සභාව විසින්දරණු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණයක් ගෙවිය හැකි බව සඳහන් කර ඇත.

ඒ අනුව 2005 ජනවාරි 08 දින රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් පාරිභෝගික අධිකාරිය වෙත පැවරීම සඳහා එකඟ වී ඇති රු 21,837,975.00ක මුදලින් රු 14,000,000.00 ක මුදල වියදම් කර ඇත්තේ පනතෙහි සඳහන් පරිදිය. විශේෂයෙන් අධිකාරියේ ප්‍රධානතම අරමුනක් වූ වෙළෙඳපල විමර්ශන කටයුතු, කිරීම පාරිභෝගිකයන් දැනුවත් කිරීම හා ඊට අදාල නිත්‍යානුකුල රාජකාරීන් (උසාවි රාජකාරි) සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට ආදී කරුණු සම්බන්ධයෙන් මෙම මුදල් යොදවා ඇත.

ඒ අනුව පාරිභෝගික සේවා අරමුදල පිහිටුවීමේදී පාදක කර ගන්නා ලද අරමුණු සඳහා <u>මෙම මුදල් යොදා ගැනීම සම්බන්ධව විරුද්ධත්වයක් නොමැත යනුවෙන් භාණ්ඩාගාර අනුමැතිය ඇත</u> යනුවෙන් ගම්‍ය වන්නේ ඉහතින් විස්තර කළ පරිදි සඳහන් කල පනත් දෙකෙහි අරමුණ හා බලතල නව පනතෙහිසඳහන් පරිදි ක්‍රියාත්මක කිරීම බැවින් මෙය අධිකාරිය බල නොලත් ගණුවෙනුවක් ලෙස නිර්වචනය කිරීම නිත්‍යානුකුල නොවේ.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

අ. අදාල තනතුරු සඳහා පුරප්පාඩු පිරවීමේදී අධිකාරිය ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව එම නිලධාරීන්ගේ අවශ්‍යතාවයේ ප්‍රමුඛත්වය පරිදි පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/E4/41/5/2551-Vol 1 හා 2013.01.04 දිනැති ලිපිය මගින් ලබා ගත් අනුමැතිය පරිදි අදාල පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ අතර මේ වන විට තනතුරු 108ක පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇත. ඒ අනුව සුදුසුකම් පත් අයදුම්කරුවන් 73ක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව එම තනතුරු සඳහා බඳවා ගෙන ඇත. තනතුරු 15ක් සඳහා සුදුසු නිලධාරීන් ඉදිරිපත්ව නොසිටි බැවින් එම තනතුරු දැනට පුරප්පාඩුව ඇත. සම්මුඛ පරීක්ෂණ අවසන් කරන ලද තනතුරු 09ක් සඳහා සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමට ඇත. එසේම සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කලාප - පාරිභෝගික කටයුතු හා තොරතුරු) තනතුරු 11ක් සඳහා සුදුසු නිලධාරීන් බඳවා ගැනීමට කළමණාකරන සේවා

දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඉල්ලුම් කර ඇත. දැනට පුරප්පාඩුව පවතින අනෙකුත් තනතුරු සඳහා අධිකාරියේ සේවාවන් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවයේ ප්‍රමුඛත්වය පරිදි කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව සඳහන් කරමි.

ආ. කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු ජ්‍යෙෂ්ඨ මාධ්‍ය නිලධාරිගේ කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. දැනට සිටින එක් රියැදුරෙකු සහ එක් කාර්යාල කාරය සහායකයෙකු ඔවුන් වෙත පවරා ඇති කාර්යයන් අවසන් වූ වහාම ඔවුන්ගේ සේවාවන් ලබා ගැනීම අවසන් කරන බව දන්වමි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක නොකිරීම

### 5.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම

අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන්නේ විෂයය භාර අමාත්‍යතුමා බැවින් සාමාජිකයින්ගේ මාසික රැස්වීම්වල සහභාගිත්වය පිළිබඳව ඔහු දැනුවත් කර ඇති අතර ඉන් සාමාජිකයන්ගේ සහභාගිත්වය දැන් යහපත් තත්වයට පත්ව ඇත. .

## 6 පද්ධති පාලනයන්

රූමි මර්ෂුක්
සභාපති